ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1988 අංක 83 දරන

# රේගු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : රු. 4.20 යි.    තැපැල් ගාස්තුව : රු. 2.30 යි.

# 1988 අංක 83 දරන රේගු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 20 වන දින]
එල්. ඩී.—ඕ. 7/87.

රේගු ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1988 අංක 83 දරන රේගු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඬු නාමය.*

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රේගු ආඥාපනතේ 4 වන වගන්තියේ පිළිවෙලින් "රුපියල් දෙසියයක" සහ "රුපියල් එක් දහසක" යන වචන වෙනුවට, "රුපියල් දස දහසක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — *235 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— — *ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

"අමාත්‍යවරයා විසින් නිලධරයන්ගේ පැමිණීමේ වේලාව තීරණය කරනු ලැබීම.

6. (1) රේගු නිලධරයන් සහ රේගු සේවයේ නියුක්ත වෙනත් තැනැත්තන්, ඔවුන්ගේ නිසි කාර්යාලවල සහ සේවා නියුක්ති ස්ථානවල රැඳී සිටිය යුතු සාමාන්‍ය වේලාවන් සහ විශේෂ වේලාවන්, අමාත්‍යවරයා විසින්, රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් රේගු නිලධරයන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ නිසි කාර්යාල සහ සේවා නියුක්ත ස්ථාන, ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය වල් පිළිබඳ අධිකාරිය පනතේ අර්ථ කථනය කළ ඇති පරිදි, නිශ්චිත වරායක් හෝ ගුවන් තොටුපළක් ඇතුළත (1) වන උපවගන්තියේ සඳහන් රේගු නිලධරයන්ගේ සහ වෙනත් තැනැත්තන්ගේ නිසි කාර්යාල සහ සේවා නියුක්ත ස්ථාන ඒ වරාය හෝ ගුවන් තොටුපළ භාර බලධරයා විමසා ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය.".

**4.** 6 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ සහ 6ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:— — *ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ සහ 6ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.*

"විශේෂ සේවය හෝ පැමිණීම සඳහා ගෙවීම.

6අ. (අ) විශේෂ සේවයක් වශයෙන් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් සේවයක්; හෝ

(ආ) තම නිසි කාර්යාලය හෝ සේවා නියුක්ති ස්ථානය නොවන යම් කාර්යාලයක හෝ ස්ථානයක යම් රේගු නිලධරයකු පැමිණ සිටීම

යම් තැනැත්තකුට අවශ්‍ය වන අවස්ථාවක, අවස්ථෝචිත පරිදි, ඒ සේවය හෝ පැමිණ සිටීම සම්බන්ධයෙන්, ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව ඒ තැනැත්තා විසින් ප්‍රධාන අයකැමිවරයාට ගෙවීම් කරනු ලැබිය යුතු ය.

රේගු නිලධරයන්ට ඉඩකඩ සහ නවාතැන් පහසුකම් තැනැත්තන් විසින් සපයනු ලැබිය යුතු බව.

6ආ. වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුව ද, රේගු නිලධරයන්ගේ නැතහොත් රේගු සේවයෙහි නියුක්ත යම් තැනැත්තකුගේ පැමිණ සිටීම හෝ සේවාවන් අවශ්‍යවනු ලබන යම් වරායක සෑම බලධරයකු විසින් හෝ යම් ස්ථානයක් හෝ ගුදමක් භාර සෑම තැනැත්තකු විසින්, රේගුව විසින් පාවිච්චි කරනු ලැබීම සඳහා ඒ වරායේ, ගුදමේ හෝ ස්ථානයේ සුදුසු නවාතැන් පහසුකම් සහ ඉඩකඩ සපයනු ලැබීම ඔහු සතු කාර්යය වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් එක් දහසක්" යන වචන වෙනුවට "රුපියල් විසිපන් දහසක්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

6. 8 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"පරස්පර විරෝධී ප්‍රකාශයක් කරන සාක්ෂිකරුවකු සම්බන්ධයෙන් විනිශ්චයකාරවරයා කටයුතු කළයුතු ආකාරය.

8අ. (1) මේ ආඥාපනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් පැවැත්වෙන නඩු විභාගයක දී යම් සාක්ෂිකරුවකු, මේ ආඥාපනත යටතේ ඒ වරද පිළිබඳව කෙරෙන යම් විමර්ශනයක දී යම් වැදගත් කරුණක් පිළිබඳව යම් රේගු නිලධරයකු හෝ 8 වන වගන්තියෙහි සඳහන් තැනැත්තකු ඉදිරියේ කරනු ලැබ, අත්සන් කරන ලද්දා වූ ප්‍රකාශයකට පරස්පරවිරෝධීව ප්‍රකාශිතව ම හෝ අවශ්‍ය ව්‍යංගයෙන් යමක් කිවහොත්, සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගැනීමේ දී ආරක්ෂා සහ යුක්තිසහගත යයි තමා සලකන්නේ නම්, මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින්—

(අ) විමර්ශනයේ දී සාක්ෂිකරු විසින් කරන ලද ප්‍රකාශයේ වැදගත් විස්තර ස්වාධීන ප්‍රභවයකින් ලැබුණු සාක්ෂි මගින් අනුසන්දානය වී ඇත්නම්, ඒ ප්‍රකාශය සම්බන්ධයෙන් ක්‍රියාකිරීම; සහ

(ආ) ඒ නඩු විභාගය අවසානයේ දී ඒ සාක්ෂි කරු විනිශ්චයට ඉදිරිපත් කරවා අධිකරණ කටයුත්තක අවස්ථාවක දී ඕනෑ කමින් ම බොරු සාක්ෂි දීම සම්බන්ධයෙන් ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරයා විසින් පිළියෙල කර, අත්සන් කරන ලද අධිචෝදනා පත්‍රයක් මත නඩු විභාග කිරීම

නීත්‍යනුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ වූ යම් නඩු විභාගයක දී අධිචෝදනා පත්‍රයෙන් කියන ලද පරස්පරවිරෝධී ප්‍රකාශ චූදිතයා කළ බව ඔප්පු කිරීම ප්‍රමාණවත් විය යුතු අතර, ඒ ප්‍රකාශ අතුරෙන් කවර ප්‍රකාශයක් බොරුදැයි කීම අවශ්‍ය නොවන්නේ ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ යම් සාක්ෂිකරුවකු පිළිබඳ නඩු විභාගයක්, සුදුසු යයි තමා සිතන යම් කාලයක් සඳහා කල්තැබීම යෝග්‍ය යයි තමා සලකන්නේ නම්, මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් එසේ කරනු ලැබිය හැකි අතර, එවැනි යම් අවස්ථාවක දී ඒ නඩු විභාගය අවසන්වන තෙක් චූදිතයා රිමාන්ඩ් භාරයට පත්කරනු ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ලේඛන හෝ භාණ්ඩ සැම්පල් ලේලා සිටීම සඳහා රේගු අයකැමිවරයා සතු බලය.

9. (1) රේගුවට අදාළ යම් කාරණයක් හෝ මේ ආඥාපනත යටතේ පරීක්ෂා කිරීම තම කාර්යය වන්නා වූ යම් කාරණයක් පිළිබඳව නිසැකව දැනගැනීමේ හෝ සත්‍යායනය කිරීමේ කාර්යය සඳහා රේගු අයකැමිවරයා විසින් හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් රේගු නිලධරයකු විසින්, ලිඛිත නියමයක් මගින්, රේගුවට අදාළ වන්නා වූ හෝ පරීක්ෂණයට විෂය වන්නා වූ යම් කාරණයක් සම්බන්ධයෙන් ඒ නියමයෙහි සඳහන් කරනු ලබන කාලසීමාවක් ඇතුළත සහ ස්ථානයක දී, යම් තැනැත්තකුගේ බලයෙහි ඇති තොරතුරු දීම නැතහොත් පොත් සහ ලේඛන හෝ යම් භාණ්ඩයක සැම්පල් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කිරීම කළ යුතු යයි ද, අවස්ථෝචිත පරිදි, ඒ පොත්, ලේඛන සහ භාණ්ඩවල සැම්පල පරීක්ෂා කිරීමට සහ ඒවායේ උධෘත සහ පිටපත් ගැනීමට ඒ නිලධරයාට ඉඩ දිය යුතු යයි ද යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා, යම් රේගු නිලධරයකු විසින් යම් තැනැත්තකු වෙත ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දිය යුතු වූ හෝ ඒ නිලධරයා විසින් ඔහුගෙන් ලබා ගැනීමට නියමිත සහ දීමට ඔහුගේ බලයෙහි ඇති යම් තොරතුරක් දිය යුතු වූ යම් තැනැත්තකු විසින්—

(අ) ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරතහොත් ;

(ආ) එයට හිතාමතාම වැරදි පිළිතුරක් දෙතොත් ;

(ඇ) ඒ තොරතුරු දීම ප්‍රතික්ෂේප කරතොත් ;

(ඈ) වැරදියයි තමා දන්නා වූ හෝ වැරදියයි විශ්වාස කිරීමට තරම් හේතු ඇත්තා වූ හෝ යම් තොරතුරක් සපයතොත් ; හෝ

(ඉ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හැරියහොත්

ඒ තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර, වරදකරු කරනු ලැබූ විට, රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම ඔහු යටත් විය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ. 9ආ සහ 9ඇ අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

8. 9 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 9අ, 9ආ සහ 9ඇ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතුය :—

**" දැන්වීම් භාරදීම.**

9අ. මේ ආඥාපනත හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් තැනැත්තකු වෙත භාරදිය යුතු යම් දැන්වීමක්, නියමයක් හෝ වෙනත් ලේඛනයක් ලියාපදිංචි තැපෑලෙන් භාර දෙනු ලැබිය හැකි අතර, එසේ භාරදෙනු ලැබුවේ නම්, එය අඩංගු ලිපිය සාමාන්‍ය තැපෑලෙන් භාරදෙනු ලබනවිට ලැබිය යුතු අවස්ථාවේ ලැබුණු ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද, දැන්වීම, නියමය හෝ වෙනත් ලේඛනය නිසි ලෙස ලිපිනය ලියා තැපෑලට දමා තිබීම එසේ භාරදීම ඔප්පු කිරීමෙහි ලා ප්‍රමාණවත් වන්නේ ය.

ඇතැම් අවස්ථාවල දී ලේඛන පිළිබඳ පූර්ව නිගමනය.

9ආ. යම් කටයුත්තක ස්වභාවය සැලකිල්ලට ගනිමින්, ඒ කටයුත්ත සාමාන්‍යයෙන් කරගෙන යාමේ දී සාදන ලදැයි පෙනී යන්නා වූ ද වෙනස් කිරීමක් හෝ වෙනත් අවස්ථාගත කරුණු හේතු කොට ගෙන අන්‍යාකාරයකින් සැකයට භාජනය නොවන්නා වූ ද යම් ලේඛනයක්—

(i) මේ ආඥාපනත යටතේ යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලැබූ විට හෝ යම් තැනැත්තකුගේ භාරයෙන් හෝ පාලනයෙන් තහනමට ගනු ලැබූ විට, හෝ

(ii) මේ ආඥාපනත යටතේ යම් තැනැත්තකු විසින් සිදු කරන ලදැයි කියන යම් වරදක් පිළිබඳ විමර්ශනය කෙරෙන අතරතුර දී ශ්‍රී ලංකාවෙන් බැහැර යම් ස්ථානයකින් ලැබුණු විට

සහ ඒ ලේඛනය, සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබූ විට, පටහැනි තත්ත්වයක් ඔප්පු කරනු ලැබ ඇත්නම් මිස, අධිකරණය විසින්—

(ආ) යම් විශේෂ තැනැත්තකුගේ අත් අකුරින් ලියැවී ඇතැයි අදහස් කෙරෙන්නා වූ හෝ යම් විශේෂ තැනැත්තකු විසින් අත්සන් කරන ලදැයි හෝ යම් විශේෂ තැනැත්තකුගේ අත් අකුරින් ලියැවී ඇතැයි අධිකරණය යුක්තිසහගත ලෙස සලකනු ලබන්නා වූ හෝ ඒ ලේඛනයේ අත්සන සහ අනු සැම කොටසක් ම ඒ තැනැත්තාගේ අත් අකුරින් ලියැවී ඇතැයි ලියා අත්සන් කරන ලද්දා වූ හෝ සහතික කරන ලද්දා වූ හෝ ලේඛනයක් සම්බන්ධයෙන් වන විට, එය ලියා අත්සන් කිරීමට හෝ සහතික කිරීමට අදහස් කළ තැනැත්තා විසින් ලියා අත්සන් කරන ලදැයි හෝ සහතික කරන ලදැයි ද පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය; තව ද

(ආ) (i)වන ඡේදයේ සඳහන් ලේඛනයක් සම්බන්ධයෙන් වන විට, ඒ ලේඛනයේ ඇතුළත් දෙයෙහි සත්‍යතාව පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

රාජ්‍ය භාෂාවෙන්, ජාතික භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පරිවර්තනයක් ඉදිරිපත් කළ යුතු බව.

9ඇ. (1) මේ ආඥාපනතේ කාර්යය සඳහා අවශ්‍ය යම් ලේඛනයක්, රාජ්‍ය භාෂාව, ජාතික භාෂාව හෝ ඉංග්‍රීසි භාෂාව නොවන භාෂාවකින් ලියනු ලැබ ඇති අවස්ථාවක, එහි නිවැරදි පරිවර්තනයක් රාජ්‍ය භාෂාවෙන්, ජාතික භාෂාවෙන් හෝ ඉංග්‍රීසි භාෂාවෙන් ඒ සමග ඉදිරිපත් කළ යුතු යයි ඒ ලේඛනය ඉදිරිපත් කරන හෝ පාවිච්චි කරන තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

නියමිත පරිදි ලේඛනවල පිටපත් ඉදිරිපත් කිරීම.

(2) මේ ආඥාපනතේ කාර්ය සඳහා යම් ලේඛනයක් ඉදිරිපත් කළ යුතු යයි යම් තැනැත්තකුට නියම කරනු ලැබ ඇති අවස්ථාවක, මේ ආඥාපනතේ කාර්ය සඳහා අවශ්‍ය යයි රේගු නිලධරයා සලකන එහි යම් තාක් පිටපත් ඉදිරිපත් කිරීමට ඔහු විසින් ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය.

(3) ආනයනය කරන ලද්දා වූ හෝ අපනයනය කරන ලද්දා වූ හෝ අපනයනය කිරීම සඳහා සටහන් කරන ලද්දා වූ හෝ පිටරට පැටවීම පිණිස සටහන් කරන ලද්දා වූ බඩු කිසිවක් වෙනුවෙන් යම් ඉන්වොයිසියක් සහ/හෝ වෙනත් යම් ලේඛනයක් රේගු නිලධරයකුට අවශ්‍ය වන්නා වූ අවස්ථාවක, ඒ ඉන්වොයිසියේ සහ/හෝ ලේඛනයේ මුල් පිටපත සහ මේ ආඥාපනතේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි යම් තාක් පිටපත් ඉදිරිපත් කළ යුතු යයි ඔහු විසින් නියම කරනු ලැබිය හැකි අතර, ඔහු විසින් ඒ පිටපත් තබාගත හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

9. 10 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"යෝග්‍ය අවස්ථාවක ආනයනය කරන ලද බඩුවලට අධිභාරයක් අය කළ යුතු බව.

10අ. (1) මේ ආඥාපනත යටතේ අයකළ හැකි තීරු බදු කිසිවකට අතිරේකව, යම් නියමයක සඳහන් ආනයනය කළ බඩු සම්බන්ධයෙන්, ඒ නියමයෙහි සඳහන් අනුප්‍රමාණ අනුව සහ කාල සීමාවන් සඳහා, ගෙවිය යුතු තීරු බදු පිළිබඳව අධිභාරයක් අය කිරීම ජාතික ආර්ථිකයේ යහපත තකා යෝග්‍ය යයි අමාත්‍යවරයා සලකතොත්, අමාත්‍ය මණ්ඩලයේ අනුමතය ඇතිව ඒ නියමය මගින් ඔහු විසින් එසේ කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද සෑම නියමයක් ම ඒ නියමයේ දින සිට බලාත්මක විය යුතු ය. එවැනි සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරන ලද යම් නියමයක් ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් දින හැටක් ඇතුළත, පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයකින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි අතර, දින හැටේ එම කාලසීමාව ආගණනය කිරීමේ දී පාර්ලිමේන්තුව වාරාවසාන කර හෝ විසුරුවා හැර ඇති යම් කාලසීමාවක් ගණින් නොගත යුතු ය. එවැනි යම් නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ නියමය ප්‍රකාර ගෙවන ලද යම් මුදලක් ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:— *ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

*"ජනරජයේ මිනුම් ඒකකවලට අනුව, ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් තීරු බදු ගෙවිය යුතු බව.*

17. (1) මේ ආඥාපනත යටතේ වූ සියලු රේගු බදු මෙන් ම සියලු දණ්ඩන සහ රාජ්‍ය සන්තක කිරීම් ද ශ්‍රී ලංකා ජනරජයේ ව්‍යවහාර මුදලින් සහ ජනරජයේ මිනුම් ඒකකවලට අනුව ගෙවීම සහ ලබා ගැනීම කරනු ලැබිය යුතු ය.

*විදේශීය ව්‍යවහාර මුදල් ජනරජයේ ව්‍යවහාර මුදල් වටිනාකම්වලට පරිවර්තනය කිරීම.*

(2) (1) වන උප වගන්තියේ කාර්යය සඳහා විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් වටිනාකම්වලට පරිවර්තනය කිරීම, ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් තීරණය කරනු ලබන සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සඳහන් කරනු ලබන සමානුපාතික සැලකිල්ලට ගනිමින් කලින් කල පළ කරනු ලබන විනිමය අනුපාතිකවලට අනුකූලව කරනු ලැබිය යුතු ය.

*රේගු බදු මගින් ලැබෙන මුදල් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු බව.*

(3) සියලු රේගු බදු මගින් ලැබෙන මුදල්, රේගු අයකැමිවරයා විසින්, ශ්‍රී ලංකා ජනරජයේ ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ 3 වන උපවගන්තියේ අතුරු වගන්තිය ඉවත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ අලුත් වගන්තිය ඇතුලත් කිරීම.

**12.** 18 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"අඩුවෙන් අයකර ගැනීම් පාඩිය නිසා අයවිය යුතු තීරු බදු සහ වෙනත් ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් වරයකු ඉදිරියේ පැවැත් වෙන නඩු කටයුතු.

18අ. (1) අයකර ගැනීම නොකර හැරියා වූ අඩුවෙන් අයකරගෙන ඇත්තා වූ, වැරදීමකින් ආපසු ගෙවන ලද්දා වූ හෝ ප්‍රතිදානය කරන ලද්දා වූ හෝ වංචනික හිමිකම් පෑමක් මත ගෙවන ලද්දා වූ හෝ තීරු බදු, බදු හෝ වෙනත් ගාස්තු කිසිවක් 18 වන වගන්තිය යටතේ අයකර ගැනීම, ක්‍රියාත්මක කළ නොහැකි යයි හෝ යෝග්‍ය නොවේ යයි ප්‍රධාන රේගු අයකැමිවරයා ගේ මතය වන යම් අවස්ථාවක, 18 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වූ ඉල්ලීමෙහි ඇතුළත් පරිදි ඒ තීරුබදු, බදු හෝ වෙනත් ගාස්තු පිළිබඳ විස්තර සහ ගෙවීම් පැහැර හැරිය තැනැත්තා ගේ නම සහ අන්තිමට දැන සිටි ව්‍යාපාරික ස්ථානය හෝ පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඔහු විසින් ඒ ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. එවිට මහේස්ත්‍රාත්වරයා විසින්, තීරුබදු, බදු හෝ වෙනත් ගාස්තු අයකර ගැනීම සඳහා ගෙවීම් පැහැර හැරිය තැනැත්තා ට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත් විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට ඔහු තමා ඉදිරියට කැඳවනු ලැබිය යුතු අතර, ප්‍රමාණවත් හේතු නො පෙන්වුවහොත් ඒ තීරු බදු, බදු හෝ වෙනත් ගාස්තු දඩයකින් පමණක් දඬුවම් කළ යුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් නොකළ යුතු වරදක් සඳහා ඒ පැහැර හැරිය තැනැත්තාට ඒ මහේස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියමිත දඩයක් ලෙස සලකනු ලැබිය යුතු ය. තවද, ඉක්බිතිව එවැනි වරදක්

සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඇ) සහ(එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයා විසින්, ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර ඒ දණ්ඩන නියමය පනවනු ලබන අවස්ථාවේ දී කළ හැකිව තිබූ යම් විධානයක් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා ප්‍රධාන ජ්‍යෙෂ්ඨ අයකැමිවරයා විසින් නිකුත් කරන ලද සහතිකයක ඇති යම් ප්‍රකාශයක් නිවැරදි බව, මේ වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී මහෙස්ත්‍රාත්වරයා විසින් ප්‍රශ්න කිරීම හෝ විභාග කිරීම කරනු නොලැබිය යුතු අතර, ඒ අනුව සහතිකයෙහි ඇති යම් ප්‍රකාශයක නිවැරදි බව සලකා බැලීමට හෝ තීරණය කිරීමට මහෙස්ත්‍රාත් වරයෙකුට ඒ උපවගන්තියෙන් වූ කිසිවකින් බලය පැවරෙන්නේ යැයි තේරුම් නො ගත යුතු ය.

(3) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ උපවගන්තිවල විධිවිධාන කිසිවක්, මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවකට අදාළ නොවිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් වූ ද පැහැර හරින තැනැත්තා වෙත නියම කරන ලදැයි ඒ උපවගන්තියෙන් සැලකෙන දඩය නොගෙවා පැහැර හැරිය තැනැත්තා බන්ධනාගාරගත කිරීම කට නියම කරනු ලැබූද යම් අවස්ථාවක, ඒ දඩ මුදල ගෙවීම සඳහා කල් දීම හෝ ඒ මුදල වාරික වලින් ගෙවීම විධාන කිරීම හෝ මහෙස්ත්‍රාත් වරයා විසින් කරනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හේතු දැක්වීම සඳහා ඒ උප වගන්තිය යටතේ කල්දීමෙහි හෝ (4) වන උප වගන්තිය යටතේ දඩය ගෙවීම සඳහා කල්දීමෙහි හෝ ප්‍රදීම කොන්දේසියක් වශයෙන්, අධිකරණය විසින් ඇප නියම කළ හැකිය; තව්ද, පැහැර හැරිය තැනැත්තා එලෙස ඇපදීමට නියම කළ විටෙක 1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(6) වාරිකවලින් ගෙවීමක් කළ යුතු යයි (4) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් විධාන කරනු ලැබ තිබිය දී, ඉන් යම් එක් වාරිකයක් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ වන විට නොගෙවා ඉතිරිව ඇති සියලුම වාරික ගෙවීම පැහැර හැර ඇත්තාක් සේ නඩු කටයුතු පැවරිය හැකි ය.

(7) (1) වන උප වගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී, තීරුබදු, බදු හෝ වෙනත් ගාස්තු ගෙවීම පැහැර හැරිය බවට ප්‍රධාන රේගු අධ්‍යක්ෂ වරයාගේ සහතිකය ප්‍රමාණවත් සාක්ෂියක් විය යුතු අතර, ඒ තීරුබදු, බදු හෝ වෙනත් ගාස්තු සාවද්‍ය යයි කියැවෙන කවර වූ හෝ උත්තර වාදයක් පිළිනොගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඇතැම් කොන්දේසි වලට යටත් ව, රේගු බදු ගෙවීමෙන් රාජ්‍ය තාන්ත්‍රික කාර්ය මණ්ඩලය ආදිය නිදහස් කිරීමේ අමාත්‍යවරයා සතු බලය.

19. (1) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින්, (කවර නාමයකින්, අභිධානයකින් හෝ පදවි නාමයකින් හැඳින්වුවද) යම් විදේශ රාජ්‍යයක ආණ්ඩුවේ ශ්‍රී ලංකා නියෝජිතයාට, එවැනි යම් ආණ්ඩුවක ශ්‍රී ලංකා නියෝජිතයාට, එවැනි යම් ආණ්ඩුවක ශ්‍රී ලංකා වෙළෙඳ කොමසාරිස්වරයාට හෝ ඒ නියමයෙහි නම් කරන ලද එවැනි යම් නියෝජිතයකුගේ හෝ කොමසාරිස්වරයකුගේ කාර්ය මණ්ඩලයේ තැනැත්තන්ට සහ එක්සත් ජාතීන්ගේ හෝ එහි අනුබද්ධ ආයතනවල සහ වෙනත් යම් ජාත්‍යන්තර සංවිධානවල, ආයතනවල හෝ මණ්ඩලවල නියෝජිතයන්ට හෝ ඔවුන්ගේ පාවිච්චිය සඳහා ප්‍රේෂණය කරන ලද, නැතහොත් ඔවුන් විසින් හෝ ඔවුන්ගේ පාවිච්චිය සඳහා ආනයනය කරන ලද හෝ බැඳුනු ගුදමෙන් නිෂ්කාෂණය කරන ලද බඩු කලින් කල රේගු බදු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින්, ස්වකීය අභිමතය පරිදි, ඒ නියමය මගින්—

(අ) නිදහස් කිරීම කරනු ලබන්නේ යම් කොන්දේසි මතද ඒ කොන්දේසි, කිසිවක් වේනොත්, නියම කරනු ලැබිය හැකි ය;

(ආ) ඒ නිදහස් කිරීම, ඒ නිලධරයන්ගේ පවුල් සහ පවුලේ පිරිවර සඳහා හෝ ඔවුන්ගේ පාවිච්චිය සඳහා ප්‍රේෂණය කරන ලද්ද වූ නැතහොත් ඔවුන් විසින් හෝ ඔවුන්ගේ පාවිච්චිය සඳහා ආනයනය කරන ලද බඩු සම්බන්ධයෙන් ව්‍යාප්ත කරනු ලැබිය හැකි ය;

(ඇ) යම් නිශ්චිත රටක හෝ සංවිධානයක (1) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ගේ ශ්‍රේණියකට හෝ පන්තියකට සහ යම් නිශ්චිත විස්තරයක භාණ්ඩවලට ඒ නිදහස් කිරීම සීමා කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කරන ලද යම් නියමයක්, එහි සඳහන් කරනු ලැබිය හැකි නියමය කිරීමට පෙරාතුව වූ දිනයක සිට බල පැවැත්විය යුතු යයි ප්‍රකාශ කර ඇත්නම්, ඒ දින සිට බල පැවැත්වෙන ලෙස සල කනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ කරනු ලද යම් නිදහස් කිරීමක් ඉල්ලා අස් කර ගැනීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම හෝ ඒ නිදහස් කිරීමට ඉඩ දෙන ලද්දේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි වෙනස් කිරීම, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් සිය අභිමතය පරිදි අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ කරන ලද කිසිම නියමයක් යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද්දේ නම් මිස බලාත්මක නොවිය යුතු ය.

(6) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ කරන ලද යම් නියමයක කුමක් සඳහන්ව ඇතද ඒ නියමය අදාළ වන්නා වූ බඩු කිසිවක්, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම කරනු ලබන අවස්ථාවෙහි ඒ බඩුවල, වටිනාකමට සහ ඒවාට අදාළ වන්නා වූ තීරුබදු අනුපාතිකවලට අනුකූලව තීරණය කරන ලද ඒ බඩු මත ගෙවිය යුතු තීරු බදු ප්‍රධාන රේගු අයකැමිවරයා වෙත ගෙවන්නේ නම් මිස, ඒවා විකිණීම හෝ බැහැර කිරීම කරනු නොලැබිය යුතු ය. මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කඩ කරමින් විකුණන ලද්දා වූ හෝ බැහැර කරන ලද්දා වූ බඩු කිසිවක් රාජ්‍ය සන්තක කිරීමට යටත් කරනු ලැබිය යුතු ය ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ජනරජයේ ජනාධිපතිවරයා විසින් කරන ලබන ආනයනය කිරීම් රේගු ආනයනය තීරුබදු වලින් නිදහස් කළ යුතු බව.

20. ශ්‍රී ලංකා ජනරජයේ ජනාධිපතිවරයාගේ නිලපරිහරණය සඳහා ආනයනය කරනු ලබන්නා වූ හෝ බැඳුම් ගුදමෙන් නිෂ්කාශනය කරනු ලබන්නා වූ සෑම විස්තරයකම භාණ්ඩ ආනයන තීරුබදු ගෙවීමට යටත් නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ප්‍රති අපනයනය කිරීමේ දී ආපසු ලබා ගැනීම්.

22. (1) යම් විදේශීය වරායකින් ආනයනය කරන ලද්දා වූ ද රේගු බදු ගෙවන ලද්දා වූ ද පහසුවෙන් හඳුනාගනු ලැබිය හැකි බඩු කිසිවක්, යම් විදේශීය වරායකට ප්‍රතිඅපනයනය කරනු ලැබූ අවස්ථාවක, ඒ තීරු බදුවලින් දහයෙන් පංගු නවයකට වැඩි නොවන මුදලක් ආපසු ලබා ගැනීම් වශයෙන් නැවත ගෙවනු ලැබිය හැකිය: එසේ වුවද, ඒ සෑම අවස්ථාවක දී ම—

(අ) ප්‍රධාන රේගු අයකැමිවරයා හෝ ඒ සඳහා බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු සෑහීමට පත්වන පරිදි ඒ බඩු හඳුනාගනු ලැබිය යුතු ය;

(ආ) බඩු පිළිබඳ අයිතියේ වෙනසක් නොමැති විය යුතු ය;

(ඇ) රේගු කාර්යාලයේ වාර්තාවලින් පෙන්නුම් කෙරෙන පරිදි ආනයනය කිරීමේ කාල සීමාව ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් විශේෂයෙන් දීර්ඝ කරනු ලැබීම, ආනයනකරුට පාලනය කළ නොහැකි අවස්ථානුගත කරුණු නිසා ප්‍රති අපනයනය කිරීම වළකන ලදැයි සළකනු ලබන්නේ නම් මිස, ආනයනය කිරීමේ දින සිට එක් වර්ෂයක් ඇතුළත ප්‍රතිඅපනයනය කිරීම කරනු ලැබිය යුතු ය;

(ඈ) ගෙවන ලද ආනයන තීරු බද්ද රුපියල් එක් සියය නො ඉක්මවූ (යම් තැනැත්තකු විසින්, ස්වකීය පෞද්ගලික පරිහරණය සඳහා තැපැල් මඟින් ආනයනය කරන ලද බඩු නොවන) බඩු සම්බන්ධයෙන් කිසිම ආපසු ලබා ගැනීමකට ඉඩ දෙනු නො ලැබිය යුතු ය;

(ඉ) ආපසු ලබාගැනීම සඳහා වූ හිමිකම් පෑම ප්‍රති අපනයනය කරනු ලබන අවස්ථාවේ දී තහවුරු කරනු ලැබිය යුතු අතර, යම් ගෙවීමක් නැවිගත කිරීම සඳහා සටහන් කරනු ලැබූ දින සිට මාස හයක් ඇතුළත ඉල්ලා සිටිනු ලැබිය යුතු ය ;

(ඊ) ආනයනය කරන ලද බඩු ප්‍රතිඅපනයනය කිරීම මත ආපසු ලබා ගැනීමකට ඉඩදෙනු ලැබූ විට, ආපසු ලබාගැනීම වශයෙන් එසේ ඉඩදෙනු ලැබූ මුදල තීරුබදු අනුපාතිකවල හෝ විනිමය අනුපාතිකවල වෙනස්කමක් තිබුනේ වී නමුදු, ඒවා ආනයනය කිරීම සිදුකරනු ලැබූ අවස්ථාවේ දී ගෙවන ලද්දා වූ හෝ ගෙවනු ලැබිය යුතු වූ තීරු බද්දෙන් දහයෙන් පංගු නවයක් නො ඉක්මවිය යුතු ය.

(2) කෙසේ වුවද, රේගු බදු ගෙවනු නොලැබූ අවස්ථාවක ආනයනය කරනු ලැබූ අවස්ථාවේ දී ගෙවනු ලැබිය හැකිව තිබූ තීරු බද්දෙන් දහයෙන් එක් පංගුවක් ගෙවනු ලැබීම මත ඒ බඩු ප්‍රතිඅපනයනය කිරීම සඳහා, (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් කොන්දේසිවලට අනුකූලව කටයුතු කර ඇතැයි තමා සෑහීමට පත් වන්නේ නම්, ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් අවසර දෙනු ලැබිය හැකි ය.".

**16.** 22 වන වගන්තියට ඉක්බිතිවම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 22අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"තීරු බද ගෙවීමක් නොමැතිව ආනයනය කිරීම.

22අ. (1) ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් හෝ තත් කාර්යය සඳහා බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින්, කලින් කල අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි නියම හා කොන්දේසිවලට යටත්ව, ප්‍රතිඅපනයනය කිරීමට අදහස් කෙරෙන භාණ්ඩ ආනයන තීරුබදු ගෙවීමක් නොමැතිව ආනයනය කිරීම සඳහා අවසර දෙනු ලැබිය යුතු ය.

(2) ආනයනය කරන ලද යම් ද්‍රව්‍යයක කොටසක් හෝ අංගයක් වශයෙන් අඩංගු වූ ද ආනයනය තීරු බදු ගෙවනු ලැබුවා වූ හෝ ඒ සඳහා ඇප තබා ඇත්තා වූ ද ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද හෝ සැලසුම් කරන ලද බඩු, අපනයනය කරනු ලැබූ අවස්ථාවක, බඩු නිෂ්පාදනයේ දී හෝ සැලසුම් කරණයේ දී යොදා ගන්නා ලදැයි තමා සෑහීමට පත් වන ආකාරයෙන් ප්‍රධාන රේගු අයකැමිවරයාට

පෙනී යාහැකි අමුද්‍රව්‍ය හෝ භාණ්ඩ ප්‍රමාණය සම්බන්ධයෙන් සැබවින්ම ගෙවන ලද්දා වූ හෝ ඇප තබා ඇත්තා වූ ආනයන තීරුබද්ද මුළුමනින්ම හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවීම හෝ ප්‍රතිදාන වශයෙන් ගෙවීම සඳහා, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි නියම මත සහ කොන්දේසිවලට යටත්ව, ඉඩදෙනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන, රටේ ආර්ථික සංවර්ධනය සැලකිල්ලට ගනිමින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මඟින් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි භාණ්ඩවලට පමණක්, අදාළ විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ව්‍යාපෘතිවල සහ ව්‍යාපාරයන්හි පරිහරණය සඳහා, රටේ ආර්ථික සංවර්ධනය කෙරෙහි සැලකිල්ලක් දක්වමින් ඔහු විසින් නියම කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව ආනයනය කරනු ලැබූ පිරියත, යන්ත්‍ර සහ උපකරණ සම්බන්ධයෙන් ගෙවූ තීරුබද්ද හෝ ඒ වෙනුවට ඇප තබා ඇති තීරුබද්ද ආපසු ලබා ගැනීම හෝ ප්‍රතිදානය සඳහා පරිහරණ කාලය, අගය ක්ෂයවීම සහ ඒ පිරියත, යන්ත්‍රය හෝ උපකරණ සම්බන්ධයෙන් වෙනත් අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, ඔහු විසින් නියම කරනු ලැබිය හැකි අනුපාතිකවලට අනුව, ප්‍රති අපනයනය කිරීමේ දී අමාත්‍යවරයා විසින් ඉඩදෙනු ලැබිය යුතු ය.

අපනයන තීරු බද්ද ආපසු ලබාගැනීම.

(5) ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කරන ලද්දා වූ හෝ උත්පාදනය කරන ලද්දා වූ යම් පන්තියක හෝ විස්තරයක බඩු ශ්‍රී ලංකාවෙන් බැහැර වූ යම් ස්ථානයකට අපනයනය කරනු ලැබ, ඉනික්බිතිව ප්‍රතිආනයනය කරනු ලැබූ අවස්ථාවක, මේ ආඥා පනත යටතේ අපනයනය කරනු ලැබූ අවස්ථාවේ දී ගෙවන ලද රේගු අපනයනය තීරු බදුවලින් ආපසු ලබාගැනීමක්, ඒ බඩු ප්‍රතිආනයනය කරන ලද්දා වූ කාලසීමාව සැලකිල්ලට ගනිමින්, ඒ බඩු සම්බන්ධයෙන් සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් ගෙවීමට අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත ඉඩ දෙනු ලැබිය යුතු ය.

වංචනික හිමිකම් පෑම සඳහා දණ්ඩනය.

(6) තීරුබදු ආපසු ලබාගැනීම හෝ ප්‍රතිපාදනය සඳහා වූ යම් වංචනික හිමිකම්පෑමක් කිරීමෙහි ලා සම්බන්ධිත සෑම තැනැත්තකුම රේගු අයකැමිවරයාගේ වරණය කිරීම මත, රුපියල් එක් ලක්ෂයකට හෝ ඒ හිමිකම් පෑම කරනු ලබන බඩුවල වටිනාකම මෙන් තුන් ගුණයකට හෝ වැඩි නොවූ දණ්ඩනයකට යටත් විය යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට, "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට, "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ "රුපියල් එක් දහසක" යන වචන වෙනුවට "රුපියල් දස දහසක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"නිශ්කාෂණය නොකිරීම සහ නැව් බඩුවලට නැවේ ලියවිලි අනුරූපී නොවීම හෝ යානාවලින් පිට කරන බඩු උචිත ස්ථාන වලදී ගොඩ බෑම නොකිරීම සම්බන්ධයෙන් නෞකාධිපති වරයාට පනවනු ලබන දණ්ඩනය.

32. ශ්‍රී ලංකාවේ යම් වරායකට, යම් නැවක් ඒ නැව පැමිණෙන ස්ථානයේ දී හෝ ස්ථානවල දී සිරිත් පරිදි දෙනු ලබන නිශ්කාෂණයක් හෝ වෙනත් ලියවිල්ලක් නොමැතිව පැමිණියහොත්, රුපියල් විසිපන්දහසකට නොවැඩි දණ්ඩනයකට නෞකාධිපතිවරයා යටත් විය යුතුය; නැතහොත් යම් නැවක් පැමිණෙන ස්ථානයෙන් දෙනු ලබන යම් නිශ්කාෂණයක හෝ වෙනත් ලියවිල්ලක සට හන් කරන ලද බඩු කිසිවක් ඒ නැව තුළ නොති බුණහොත් හෝ එහි තිබී සොයාගත් ප්‍රමාණයේ අඩුවක් තිබුණහොත් සහ නිසි පරිදි ඌනතාව ගිණුම් ගත කර නොතිබුණහොත් එහෝ නැවෙන් සවන ලද බඩු නියමිත ස්ථාන වල දී ගොඩබෑම නොකළහොත්, නැති වූ හෝ අඩු වූ සහ ගිණුම්ගත නොකළ බඩු කිසි වක් සම්බන්ධයෙන් ඒ බඩුවලට තීරුබදු අය කරන්නේ නම්, සහ ඒ තීරුබදු ප්‍රමාණය නිසැකව දැනගත හැකි නම්, රුපියල් විසිපන්දහසක් වූ දණ්ඩන මුදලක් හෝ ඒ පිළිබඳ අයකළ හැකි තීරුබදු ප්‍රමාණය නොඉක්මවන මුදලක් යන දෙකින් වඩා වැඩි මුදල් ප්‍රමාණයකට නැතහොත් ඒ තීරුබද්ද නිසැකව දැනගත නොහැකි නම් හෝ ඒ බඩුවලට තීරු බද්දක් අය නොකරන්නේ නම්,

නැති වූ හෝ අඩු වූ එක් ඇසුරුමක් සම්බන්ධයෙන් රුපියල් දස දහසක් නොඉක්මවන දණ්ඩන මුදල කට නෞකාධිපතිවරයා යටත් විය යුතු අතර, ඒ දණ්ඩන මුදල ගෙවීමට ද, එය ගෙවීමට එසේ යටත් වූ සහ එය ගෙවීම ප්‍රතික්ෂේප කරන යම් යාත්‍රාවක අධිපතිවරයාට නිශ්කාෂණයක් දීම ප්‍රතික්ෂේප කිරීමට ද නියම කිරීම සඳහා රේගු අයකැමිවරයාට බලය ලැබේ:

එසේ වුවද, නිශ්කාෂණය නොමැති විටෙක, ඒ පිළිබඳ හේතු දක්වීමක් පිළිගැනීමෙන් හෝ සංශෝධිත වර්තාවක් සැපයීමෙන් පැහැදිලි වැරදි නිවැරදි කර ගැනීමට හෝ අනවධානය නිසා හෝ අහම්බෙන් සිදුවන අඩුපාඩු සකස්කර ගැනීමට, යම් නැවක අධිපතිවරයාට සිය අභිමතය පරිදි ඇස්තමේන්තු කළ තනි තිරු බද්දක් පිළිගැනීමෙන් හෝ රේගු අයකැමිවරයා වළක්වාලන කිසිවක් මෙහි ඇතුළත් වී ඇතැයි තේරුම් නොගත යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ "රුපියල් දෙදහසක්" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"මාර්ගස්ථ බඩුවලට සහ නැව් හුවමාරු බඩුවලට තීරුබදු ගෙවීමක් නොමැති බව.

37. (1) ශ්‍රී ලංකාවෙන් බැහැර යම් වරායක් කරා යාත්‍රාවකින් මාර්ගස්ථ කිරීම සඳහා අදහස් කළ බඩු වශයෙන් ආනයන නැව් බඩු ලේඛනයේ සඳහන් බඩු වන්නා වූ එම යාත්‍රාවේ ම ඇති බඩු කිසිවකට තීරුබදු ගෙවීමක් නොමැතිව එසේ ගෙනයාම සඳහා ඉඩදෙනු ලැබිය හැකි ය.

(2) රේගු අයකැමිවරයාගේ හෝ වෙනත් නිසි නිලධරයකුගේ විශේෂ නියමයකින් සහ බඩු පිළිබඳ නිසි සටහනකින් පසුව, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත් ව හැර, බඩු කිසිවක් නැවකින් නැවකට හුවමාරු කරනු නොලැබිය යුතු ය. මේ වගන්තියේ විධිවිධානවලට පටහැනිව බඩු කිසිවක් යාත්‍රාවකින් වෙනත් යාත්‍රාවකට හුවමාරු කරනු ලැබුව හොත් හෝ එක් යාත්‍රාවකින් වෙනත් යාත්‍රාවකට ඉවත් කිරීමට තැත් කළහොත්, ඒ බඩු, බෝට්ටුව සහ ඒ බඩු ගෙනයාමට යොදාගනු ලැබූ වෙනත් දේවල් ද සමග තහනමට ගනු ලැබිය හැකි අතර, රජය සන්තක කිරීමට යටත් කරනු ලැබිය යුතු ය.".

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් දස දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය ඉවත් කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"වෙනත් ලේඛන සමඟ රේගු සටහන් කරය ආනයනකරු විසින් භාර දිය යුතු බව.

47. තීරුබදු ගෙවීම සඳහා හෝ ගුදම් ගත කිරීම සඳහා හෝ ගුදමින් පිටතට ගැනීමේ දී තීරුබදු ගෙවීම සඳහා හෝ මෙරටට එන බඩු කිසිවක් පිළිබඳ සටහන් කරන තැනැත්තා විසින්, ඒ බඩු තීරුබදුවලින් නිදහස් වුවද, රේගු අයකැමිවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් ඒ සඳහා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ප්‍රමාණයක සහ වර්ණයකින් හෙබි ආකෘතියක වූ ඒ බඩු පිළිබඳ රේගු සටහන් කරයක් රේගු අයකැමිවරයා වෙත භාරදෙනු ලැබිය යුතු ය. තවද, බඩු ආනයනය කරන ලද්දා වූ නැවේ සහ නැවේ අධිපතිවරයාගේ සහ ඒවා ගෙනෙන ලද ස්ථානයේ නම් ද ඒ බඩු ගුදම් ගත කළ යුතු නම් ගුදමේ විස්තරය හා පිහිටීම ද බඩු සටහන් කරනු ලැබිය යුත්තේ යම් තැනැත්තකුගේ නමින් ද ඒ තැනැත්තාගේ නම ද, බඩුවල ප්‍රමාණය, අගය සහ විස්තරය ද බඩු ඇතුළත් ඒ ඒ ඇසුරුම්වල අංකය, මාන සහ අභිධානය හෝ විස්තරය ද සැපයිය යුතු යයි ඒ නිවේදනයෙන් හෝ තදනන්තර නිවේදනයකින් රේගු අයකැමිවරයා විසින් ඔහුට නියම කරනු ලබන වෙනත් විස්තර ද ප්‍රකාශ කෙරෙන වචනවලින් පැහැදිලිව සහ දීර්ඝ වශයෙන් ලිවිය යුතු ය. තවද, ඒ සටහන් කරයෙහි තීරුවෙහි ඒ ඇසුරුම්වල ඒ ඒ ලකුණු සහ අංක රූප රේඛනය කරනු ලැබිය යුතු ය. රේගු සටහන් කරයේ දක්වා ඇති විස්තර ගැසට් පත්‍රයේ පළ කෙරෙන නිවේදනයෙන් රේගු අයකැමිවරයා විසින් නියම කරනු ලබන විස්තර ඇතුළත් ලේඛන මගින් සනාථ කරනු ලැබිය යුතු ය. ඉහත කී පරිදි රේගු සටහන් කරයක් පිළියෙල කර ඒ ලේඛන මගින් සනාථ කර භාරදීම ඒ තැනැත්තා පැහැර හරියහොත් රුපියල් එක් දහසකට නොවැඩි දණ්ඩනයකට

යටත් විය යුතු ය. ඒ සටහන්කරයේ සඳහන් බඩු සම්බන්ධයෙන් ගෙවනු ලැබිය හැකි තීරු බදු සහ ගාස්තු ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතු ය. ඒ තැනැත්තා විසින් ඒ අවස්ථාවේ දී ම, ඒ සටහන්කරයේ අනු පිටපත් දෙකක් හෝ වැඩි ගණනක් ද භාර දෙනු ලැබිය යුතු ය. ඒ සටහන් කරයෙහි සියලුම මුදල් ප්‍රමාණ සහ අංක ඉලක්කම් වලින් ප්‍රකාශ කරනු ලැබිය යුතු අතර, ඒ සටහන් කරයෙහි ඇතුළත් කළ යුතු විස්තර පහසුවෙන් කියවිය හැකි පරිදි ලියා රේගු අයකැමිවරයා විසින් නියම කරනු ලබන පරිදි ආකෘතියකට හා ආකාරයකට පිළියෙල කරනු ලැබ අනුපිට පත් සංඛ්‍යාවක් ද තිබිය යුතු ය. ඒ රේගු සටහන් කරය රේගු අයකැමිවරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද තැනැත්තා විසින් අත්සන් කරනු ලැබ, නියම බලධරයා වෙත යවනු ලැබූ විට, ඒ බඩු පරීක්ෂා කිරීම සහ භාරදීම සඳහා ඔහු ලද බලපත්‍ර යක් වන්නේය. එහෙත් ඒ බඩු, රේගු සටහන්කර යේ දැක්වෙන විස්තර හා නොසැසඳේ නම්, ඒවා රාජ්‍ය සන්තක කරනු ලැබිය යුතු අතර, ඒවා සමග සටහන් කළ යුතු හෝ ඇහිරිය යුතු වෙනත් සියලු බඩු මෙන්ම ඒවා අඩංගු කරන ලද ඇහුරුම් ද ඒ රාජ්‍ය සන්තක කිරීමට ඇතුළත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ **50අ අලුත්** වගන්තිය ඇතුළත් කිරීම

**28.** 50 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මේසින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 50අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

"කොන්දේසි සහිතව රේගු බදු සහ වෙනත් අයවීම් වලින් නිදහස් කරන **ලද බඩුවලට** අදාල කලයුතු ක්‍රියා මාර්ගය.

50අ. (1) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද බඩු කිසිවක්—

(අ) ඒවා ආනයනය කිරීමේ දී තත්කාර්යය සඳහා නිශ්චිත යම් කොන්දේසිවලට යටත්ව රේගු බදු හෝ අයකළ හැකි වෙනත් අයවීම් ගෙවීමෙන් නිදහස් කරනු ලැබූ හෝ අඩු කරන ලද අනුප්‍රමාණවලට අනුව රේගු බදු අයකරනු ලැබූ ;

(ආ) ඒවා ආනයනය කිරීමෙන් පසුව සපුරාලිය යුතු යම් කොන්දේසිවලට යටත්ව, වෙනත් යම් නීතියක් යටතේ ශ්‍රී ලංකා වට ගෙන ඒමට අවසර දෙනු ලැබූ

අවස්ථාවක, සහ ඒ කොන්දේසිවලට අනුකූලව කටයුතු නොකරනු ලබන අවස්ථාවක, ඒ බඩු රාජ්‍ය සන්තක කරනු ලැබිය යුත ය.

(2) ඒ බඩු රාජ්‍ය සන්තක කරනු ලැබූ අවස්ථාවේ දී, ඒ බඩු ආනයනය කරන ලද්දේ යම් තැනැත්තකුගේ නමින් ද, ඒ තැනැත්තා සන්තකයේ ඒවා නොතිබුණේ නොත් එවිට ඒ තැනැත්තා විසින් ඒ බඩු ආනයනය කරනු ලැබූ අවස්ථාවේ දී ඒ බඩුවල වටිනාකම මෙන් තුන් ගුණයකට නොවැඩි මුදලක් රාජ්‍ය සන්තක කිරීම වෙනුවෙන් ගෙවනු ලැබිය යුතු ය.

(3) නිශ්චිත කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම සඳහා හෝ ගෙවිය යුතු තීරු බදු ගෙවීම සඳහා හෝ මේ ආඥාපනතේ වෙනත් යම් විධිවිධාන යටතේ යම් ප්‍රතිඥාවක් හෝ ඇපයක් දී ඇත්තේ හෝ නොමැත්තේ වුවද මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු අතර, මේ වගන්තිය යටතේ බඩු කිසිවක් රාජ්‍ය සන්තක කිරීමෙන් එවැනි යම් ප්‍රතිඥාවක් හෝ ඇපයක් දී ඇත්තා වූ යම් තැනැත්තකුගේ යම් බැඳීමක් කෙරෙහි බල නොපෑ යුතු ය.".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අගය අනුව නියම කෙරෙන තීරුබදු සඳහා බඩුවල වටිනාකම.

51. භාණ්ඩ ආනයනය කරනු ලැබීමේ දී නියම කරනු ලබන තීරුබදු ඒවායේ අගය අනුව අය කරනු ලැබූ සියලුම අවස්ථාවල දී ඒ එක් එක් භාණ්ඩයේ ඒ ඒ අගය, ඒවායේ විස්තරය සහ ප්‍රමාණය සමග සටහනෙහි ප්‍රකාශ කරනු ලැබ ආනයනකරු විසින් හෝ ඔහුගේ අනුයෝජිතයා විසින් ප්‍රකාශයක් මගින් යථා පරිදි සහතික කළ යුතු අතර 'ඉ' උපලේඛනයේ විධිවිධානවලට අනුකූලව ඒ අගය තීරණය කරනු ලැබිය යුතු ය. තවද එසේ තීරණය කරන ලද අගයක් මත තීරුබදු ගෙවනු ලැබිය යුතුය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**30.** ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“ අනුකූලව කටයුතු නොකිරීම හෝ වැරදි ප්‍රකාශ සම්බන්ධයෙන් රාජ්‍යසන්තක කිරීම.
බඩු ආපසු ලබාගත නොහැකි විට, ඒවායේ අගය රාජ්‍ය සන්තක කිරීම.

52. බඩු කිසිවක් සම්බන්ධයෙන් ප්‍රකාශිත අගය ‘ඉ’ උපලේඛනයේ විධිවිධානවලට අනුකූල නොවන බව සහ ප්‍රකාශය වැරදි බව දැන දැනම ඒ ප්‍රකාශය කර ඇති බව රේගු නිලධරයන්ට පෙනී යන අවස්ථාවක, ඒ ප්‍රකාශය කරන ලද්දේ යම් බඩු සම්බන්ධයෙන් ද ඒ බඩු, ඒවා අඩංගු ඇසුරුම් ද සමඟ රාජ්‍ය සන්තක කරනු ලැබිය යුතු ය. ඒ බඩු ආපසු ලබා ගත නොහැකි අවස්ථාවක, රේගු අයකැමිවරයාගේ වරණය මත, ඒ බඩුවල වටිනාකම මෙන් තුන් ගුණයක් රාජ්‍ය සන්තක කිරීමට හෝ රුපියල් දෙදහසක දණ්ඩනයකට ඒ වැරදි ප්‍රකාශය කරනු ලබන තැනැත්තා යටත් විය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**31.** ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

“ නිසි නිලධරයා විසින් ගබඩා බිල් පත්‍රය නිකුත් කළ හැකි බව.

54. ප්‍රතිඅපනයනය කරනු ලද බඩු කිසිවක් අපනයනය කිරීම සඳහා සටහන් කරන ලද්දේ යම් තැනැත්තකුගේ නමින් ද ඒ තැනැත්තා විසින්, සටහන සහ යැවෙන බඩු නිශ්කාෂණයට සහ ලැබෙන හා යැවෙන ඇසුරුම් දෙවර්ගයේම ලකුණු සහ අංක සහිතව ඒ ලැබෙන බඩු පිළිබඳ වාර්තාවට යොමු කරමින් ඒ බඩුවල විස්තර පිළිබඳ තමා විසින් අත්සන් කරනු ලද නිශ්චිත ගිණුමක් රේගුවේ නිසිනිලධරයා වෙත භාර දෙනු ලැබිය යුතුය: තවද, ඒ බඩු නීත්‍යනුකූලව අපනයනය කරන ලදැයි තීරණය කෙරෙන නිලධරයා විසින්, ඒ සඳහා ගබඩා බිල් පත්‍රයක් දෙනු ලැබිය යුතුය; තවද, අපනයනය කිරීම සඳහා ඒ බඩු සටහන් කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකුගේ නමින් ද ඒ තැනැත්තා ඒවායේ අයිතිකරු නොව, ඔහුගේ අනුයෝජිතයා වෙතොත් ඔහු විසින් තමා ඒ අනුයෝජිතයා වශයෙන් සේවයේ නියුක්ත කරවන ලද තැනැත්තාගේ නම ඒ ගබඩා බිල්පත්‍රයෙහි ප්‍රකාශ කරනු ලැබිය යුතු ය: තවද, එසේ ආපසු එවූ බඩු ප්‍රේෂණය කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා ඒ අයිතිකරු හෝ අපනයනකරු නොවන්නේ නම්, ඔහු විසින් ඒ බඩු තමා වෙත ප්‍රේෂණය කරන ලද්දේ යම්

අනුයෝජිතයා විසින් සේවා නියුක්තයාගේ නම ප්‍රකාශ කළ යුතු බව.

අයිතිකරු කවුරුද යන්න ප්‍රේෂණලාභියා ප්‍රකාශ කළ යුතුය.

අනන්‍යතාව සහ අයිතිකරු නොවෙනස් බවට අයිතිකරු ප්‍රකාශ කළ යුත බව.

තැනැත්තාගේ පරිහරණය සඳහා ද ඒ තැනැත්තාගේ නම ඒ ගබඩා බිල්පත්‍රයෙහි ප්‍රකාශ කර එය අත්සන් කරනු ලැබිය යුතු අතර, නිසැකව දැන ගත් හැකි අයිතිකරු විසින්, එසේ අපනයනය කරන ලද්දා වූ සහ එසේ ආපසු එවන ලද්දා වූ බඩු පිළිබඳ අනන්‍යතාව සම්බන්ධයෙන් සහ එසේ අපනයනය කරනු ලැබූ සහ ප්‍රතිආනයනය කරනු ලැබූ අවස්ථාවේ දී, ඒ බඩුවල අයිතිකරු තමා බව ටත්, ඒකාලය අතරතුර දී ඒ බඩු වෙනත් යම් තැනැත්තකුට නොවිකුණු හෝ බැහැර නොකළ බවටත් ඒ ගබඩා බිල් පත්‍රයෙහි ප්‍රකාශයක් කර, අත්සන් කරනු ලැබිය යුතු ය. තවද, ඒ ප්‍රකාශය

ගබඩා බිල්පත්‍රය මඟින් ප්‍රවේශය ලබාදිය යුතු බව.

රේගු අයකැමිවරයා ඉදිරිපිට දී කරනු ලැබීමෙන් ඉක්බිතිව රේගු අයකැමිවරයා විසින් ඒ බඩු ගබඩා බිල්පත්‍රය මඟින් ප්‍රවේශයට පිළිගනු ලැබ, ඒ අනුව, ඔහුගේ බලපත්‍රය ප්‍රදානය කළ යුතු ය:

ගබඩා බිල්පත්‍රය දීම සඳහා කොන්දේසි.

එසේ වුවද, කවර වූ අවස්ථාවක දී හෝ බඩු අපනයනය කරනු ලබන විට අයකරනු ලැබූ යම් රේගු බද්දක් ආපසු ලබා ගැනීමකට හෝ ප්‍රතිදානයකට ඉඩදෙනු ලැබූ අවස්ථාවක හෝ මුල් ප්‍රවේශයේ දී රේගු බදු ගෙවීමෙන් තොරව බඩු බැඳුම්ගුදමෙන් අපනයනය කරනු ලැබූ අවස්ථාවක හෝ ඒ ආපසු ලබා ගැනීමේ හෝ ප්‍රතිදානයේ මුදලට සමාන රේගු බදු සහ ඒ බඩු වෙනුවෙන් හෝ ආනයනය කරන ලද භාණ්ඩය නිෂ්පාදනයේ දී පාවිච්චි කරනු ලැබිය හැකි බඩුවල යම් කොටසක් වෙනුවෙන් ගෙවනු ලබන තීරු බද්දක් වෙතොත් එය ද ගෙවනු ලැබිය යුතු ය.".

**32.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ "රුපියල් එක් දහසක" යන වචන වෙනුවට, "රුපියල් දස දහසක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තියේ "රුපියල් එක්සිය යක" යන වචන වෙනුවට, "රුපියල් එක් දහසක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට, "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තිය සංශෝධනය කිරීම.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ "රුපියල් හාර සියයක" යන වචන වෙනුවට "රුපියල් පන් දහසක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම.

**36.** ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට, "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

**37.** ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ "රුපියල් හාර සියයක" යන වචන වෙනුවට, රුපියල් පන් දහසක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

**38.** ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට, "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.

**39.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියේ (1) වන උපවගන්තියෙහි "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට, 'රුපියල් දස දහසක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**40.** ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"බඩු ගුදම් ගතකිරීම සඳහා ගුදම් නියම කිරීමේ බලය.

69. මේ ආඥාපනතේ කාර්ය සඳහා, සිය අත්සන යටතේ ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින්, ගුදම් හෝ ආරක්ෂා ස්ථාන ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර, ඒ ගුදම් හෝ ස්ථානවල කිනම් විවිධ කොටස් හෝ අංශවල සහ කිනම් ආකාරයකින් කිනම් නියෝග යටතේ කවර වූ සමන ආකාරයේ බඩු මුල් ප්‍රවේශයේදී තීරුබදු ගෙවීමෙන් තොරව ගුදම් ගත කළ හැකිද, තබාගත හැකිද, ආරක්ෂා කළ හැකිද, යන බවට විධාන කරනු ලැබිය හැකි ය. තවද, ගුදම් ගත කළ යුතු බඩුවල ස්වභාවය සහ අගය සැලකිල්ලට ගනිමින්, ඉහත කී පරිදි එසේ නියම කරන ලද යම් ගුදමක් සම්බන්ධයෙන් හෝ එහි තැන්පත් කරන ලද බඩු කිසිවක් සම්බන්ධයෙන් හෝ ඒ මත අයවිය යුතු තීරුබදු පිළිබඳ ආරක්ෂාව සඳහා හෝ කුමන අවස්ථාවල දී සහ කුමන ඇප කරුවන් සහිතව කෙබඳු මුදල් ප්‍රමාණයකට බැඳුම්කරයකින්වූ ඇපයක් හෝ වෙනත් යම් ඇපයක් අවශ්‍ය බවට ද විධාන කරනු ලැබිය හැකි ය ; තවද, එවැනිම දැන්වීමක් මගින් එවැනි යම් නියම කිරීම්

හෝ ප්‍රකාශ එහි ගුදම්ගත කළ යුතු බඩුවල රැක වරණය සහ ආරක්ෂාව සැලකිල්ලට ගනිමින්, ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකි ය ; එහෙත්, ගුදම් නියම කිරීම් හෝ ඒවා ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ එවැනි සෑම දැන්වීමක් ම අමාත්‍යවරයාගේ අනුමත යට යටත් විය යුතු අතර, එය ඔහු විධාන කරන ආකාරයකින් පළ කරනු ලැබිය යුතු ය :

නිශ්චිත වරායවල ගුදම් නියම කිරීම.

එසේ වුව ද, 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය වල් පිළිබඳ අධිකාරිය පනතෙහි අර්ථ කථනය කර ඇති පරිදි, නිශ්චිත වරායක් හෝ ගුවන් තොටු පළක් ඇතුළත යම් ගුදමක් හෝ ආරක්ෂා ස්ථාන යක් නියම කිරීම අවස්ථාවෝචිත පරිදි ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හෝ ඒ ගුවන්තොටුපළ භාරව ඇති බලධරයාගේ එකඟත්විය ඇතිව කළ යුතු ය.''.

41. ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" රේගු අයකැමි වරයා විසින් නියම කරන ලද පරිදි ගුදම් භාරකරු ඇප තැබිය යුතු බව.

70. ඉහත කී පරිදි අනුමත කරන ලද්දා වූ ද නියම කරන ලද්දා වූ ද සෑම ගුදමකම අයිතිකරු හෝ අධිවාසිකයා විසින් හෝ ඔහු වෙනුවෙන් වෙනත් තැනැත්තකු විසින්, කවර වූ විටෙක හෝ එහි ගුදම්ගත කරන ලද ඒ සියලු බඩු සම්බන්ධ යෙන් 84 වන වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි නිෂ්පාදනය කිරීමේ හෝ එකලස් කිරීමේ යම් සැලසුම්කරණයකින් පසු අපනයනය කිරීම සඳහා හෝ අපනයනය කිරීම සඳහා නිසි ප්‍රවේශයේ දී හෝ නිසිප්‍රවේශය ලබා ගැනීම සඳහා ආනයනය කිරීමේ පූර්ණ තීරුබදු ගෙවීම සඳහා ඇප කරුවන් ඇතිව හෝ නැතිව බැඳුම්කරයකින් ඇප තැබීම හෝ රේගු අයකැමිවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි වෙනත් යම් ඇපයක් තැබීම හෝ තැබීමට සැලැස්වීම කරනු ලැබිය යුතු අතර, එවැනි ඇපයක් තබන තුරු එවැනි යම් ගුදමක කවර වූ හෝ බඩු ගුදම්ගත කරනු නොලැබිය යුතු ය.''.

42. ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" ගුදම්ගත කරන ලද බඩුවල ලකුණු කිරීම සහ අංක යෙදීම ආදිය කළ යුතු බව.

74. ගුදම්ගත කිරීම සඳහා එසේ සටහන් කරන ලද සියලු බඩු යම් ගුදමක තැන්පත් කිරීමට පෙර, අයිතිකරුගේ, ආනයනකරුගේ හෝ ප්‍රේෂණලාභි යාගේ කෙටි අත්සන් සහිත පහසුවෙන් කියවිය හැකි අකුරුවලින් හෝ වෙනත් හැඳිනීම් ලකුණු

ගුදම්ගත කෙරුණ බඩු ඇගිරීම.

වලින් නිසි ලෙස ලකුණු කර, අංක යෙදිය යුතු අතර, රේගු අයකැමිවරයා හෝ නිසි නිලධරයා විධානය කරන ආකාරයකට සහ ගුදමේ කොටස්වල හෝ අංශවල ඇති සෑම ඇහුරුමකටම හෝ පාර්සලයකට ද කිට්ටු විය හැකි පරිදි ඒ බඩු ඇගිරිය යුතු ය. තව ද, ඇහුරුම කැඩුනහොත්, ඒ ඇහුරුම කඩන තැනැත්තා විසින් රේගු අයකැමිවරයා නියම කරන ආකාරයකට බඩු නැවත ගොඩගැසීම කරනු ලැබිය යුතු ය.

දණ්ඩනය.

මෙහි මින් පෙර විධාන කර ඇති පරිදි ඇගිරීම හෝ නැවත ගොඩගැසීම අතපසු කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නිසා ගුදමේ අධිවාසිකයා හෝ එසේ කඩකිරීමක් කරන තැනැත්තා රුපියල් දස දහසකට නොවැඩි දණ්ඩනයකට යටත් වන්නේ ය.

ගදම් යතුරු ලෑම සහ විවෘත කර තැබීම.

කලින් කල රේගු අයකැමිවරයා නියම කරන ආකාරයට ගුදම යතුරුලෑම සහ සුරක්ෂිත කිරීම ද, එසේ ඔහු නියම කරන දිනවල දී හා වේලාවන් තුළ ගුදම විවෘත කර තැබීම ද, කරනු ලැබිය යුතු ය.

ගුදම්වලට සහ ගුදම් වලින් බඩු ගෙනයාම.

තව ද, රේගු අයකැමිවරයා විසින් විධාන කරනු ලබන වේලාවන් තුළ සහ නිලධරයන් ඉදිරිපිට දී සහ නියෝගවලට යටත්ව පමණක් ගුදමට යා යුතු අතර, ඒ සියලු බඩු ආනයනය කරනු ලැබූ විට ගොඩබෑමෙන් පසු, ගුදමට ගෙනයාම හෝ අපනයනය කිරීම සඳහා හෝ ගබඩා කිරීම සඳහා ගුදමින් පිටතට ගැනීමෙන් පසු නැව්ගත කිරීම සඳහා ගෙන යාම, රේගු අයකැමිවරයා විසින් විධාන කරනු ලබන පරිදි නියෝග යටතේ කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තිය සංශෝධනය කිරීම.

43. ප්‍රධාන ප්‍රඥප්තියේ 76 වන වගන්තියේ "රුපියල් සියයක" යන වචන වෙනුවට, "රුපියල් පන් දහසක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම.

44. ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට, "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

45. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට, "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ සහ 84ආ අලුත් වගන්ති ඇතුලත් කිරීම.

**46.** 84 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුලත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ සහ 84ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය:—

"ගුදම්වල බඩු නිෂ්පාදනය කිරීම හෝ එකලස් කිරීම ද ඇතුළු සැලසුම්කරණය

84අ. (1) මේ ආඥාපනතේ 69 වන වගන්තිය යටතේ නියම කරන ලද යම් ගුදමක් තුළ බඩු නිෂ්පාදනය කිරීම හෝ එකලස් කිරීම ද ඇතුළු සැලසුම්කරණයට රටේ ආර්ථික සංවර්ධනයේ යහපත තකා ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් අවසර දීම නීත්‍යනුකූල වන්නේ ය.

(2) ඒ ගුදමේ නිෂ්පාදනය කිරීම හෝ එකලස් කිරීම ද ඇතුළු යම් සැලසුම්කරණයකට යටත් වූ බඩු කිසිවක්, රේගු අයකැමිවරයාගේ පූර්ව අනුමතය නොමැතිව දේශීය පරිහරණය සඳහා හෝ අපනයනය කිරීම සඳහා හෝ මුදාහැරීම කළ නොහැකි ය.

(3) ඒ බඩු දේශීය පරිහරණය සඳහා ඒ ගුදමෙන් මුදාහරිනු ලැබූ අවස්ථාවක, ඒ මුදාහැරීම කරනු ලැබූ අවස්ථාවේ දී ඒ බඩු ආනයනය කරන ලදැයි සලකා ඒ සම්බන්ධයෙන් වූ තීරු බදු ගණන් බැලීම සහ ගෙවීම කරනු ලැබිය යුතු ය.

නිෂ්පාදනයේ දී පරිභෝජනය කරන ලද, අපතේ ගිය කසළ බවට පත් වූ බඩු පිළිබඳ තීයා කිරීම.

(4) තීරු බදුවලට යටත් බඩු (1) වන උපවගන්තිය යටතේ අවසර දෙන ලද සැලසුම්කරණයේ දී අපතේ ගියා වූ හෝ කසළ බවට පත්වූ හෝ පරිභෝජනයට ගන්නා ලද්දා වූ හෝ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ අපතේ යාම, කසළ බවට පත්වීම හෝ පරිභෝජනයට ගැනීම හා සමවූ බඩුවල ඒ කොටස සම්බන්ධයෙන් ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් තීරු බදු අඩුකරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, ඒ අපතේ ගියාවූ හෝ කසළ බවට පත්වූ කොටස, ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව විනාශයට පත්කරනු ලබන්නේ නම්, ඒ අපතේ ගියා වූ හෝ කසළ බවට පත් වූ කොටස සම්බන්ධයෙන් කිසිම තීරු බද්දක් අය නොකළ යුතු ය: නැතහොත් එය දේශීය පරිහරණයට ගනු ලැබුවේ නම් ඒ ආකාරයෙන් ආනයනය කරන ලදැයි සලකා තීරු බදු ගෙවිය යුතු ය.

කොන්දේසි, ගාස්තු සහ අයකිරීම්.

(5) 84ආ වගන්තියේ සඳහන් නිෂ්පාදකයකුට හෝ අතුරු කොන්ත්‍රාත්කරුවකුට අවසර පත්‍රයක් දිය යුත්තේ යම් කොන්දේසි යටතේ ද ඒ කොන්දේසි පිළිබඳව ද අවසර පත්‍රය සඳහා වන ගාස්තු සහ අයකිරීම් පිළිබඳව ද අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

ඇතැම කොන්දේසි යටතේ අතුරු ගිවිසුම් සඳහා නිෂ්පාදකයාට අවසරදීම.

84ආ. (1) මේ ආඥාපනතේ 69 වන වගන්තිය යටතේ නියම කරන ලද යම් ගුදමක් බඩු නිෂ්පාදනය කිරීම හෝ එකලස් කිරීම ද ඇතුළු සැලසුම්කරණයේ යෙදීම සඳහා අවසරය ලද යම් නිෂ්පාදකයකු විසින්, පහත දැක්වෙන කරුණු පිළිබඳව ප්‍රධාන රේගු අයකැමිවරයා සෑහීමට පත් වේ නම්, මේ ආඥාපනත යටතේ ගුදමක් වශයෙන් නියම නොකරන ලද යම් කර්මාන්ත ශාලාවක හෝ ස්ථානයක නිෂ්පාදනය හෝ එකලස් කිරීම ද ඇතුළු සැලසුම්කරණයේ යෙදීම සඳහා වෙනත් තැනැත්තකු සමග අතුරු ගිවිසුමකට එළඹිය හැකි ය :—

(i) ඒ වැඩ සඳහා එකී කර්මාන්ත ශාලාව හෝ ස්ථානය ප්‍රධාන රේගු අයකැමිවරයා වෙත ලියාපදිංචි කර තිබීම ;

(ii) නියමිත අතුරු ගිවිසුම් වැඩ භාර ගැනීමේ ශක්තිය කර්මාන්ත ශාලාවට හෝ ස්ථානයට තිබීම ;

(iii) නිෂ්පාදකයා සහ අතුරු ගිවිසුමට එළඹෙන තැනැත්තා අතර ලිඛිත ගිවිසුමක් තිබීම සහ ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් ගිවිසුම අනුමත කර තිබීම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි අතුරු ගිවිසුම් ක්‍රම මගින් සැලසුම්කරණයේ යෙදීම සඳහා යම් නිෂ්පාදකයකුට අවසර දෙනු ලැබ ඇති අවස්ථාවක, එසේ සැලසුම්කරණයට භාජනය වූ බඩු කිසිවකට 84අ වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

(3) ඉහත කී පරිදි නිෂ්පාදකයා විසින් අතුරු ගිවිසුමකට එළඹුනේ වුව ද, රාජ්‍ය සන්තක කිරීම් සහ දණ්ඩනයන් ඇතුළු මේ ආඥාපනත යටතේ වූ වෙනත් යම් වගකීම්වලට අතිරේකව, එම අතුරු ගිවිසුම් කටයුතු මෙහෙයුමේ දී නිෂ්පාදකයා සතු ගුදමෙන් පිටත දී සිදු වූ, ද්‍රව්‍ය හෝ නිමිකළ නිෂ්පාදන නැතිවීමක් හෝ පලුදුවීමක් හේතුකොටගෙන අයවිය හැකි යම් තීරු බදුවලට හෝ වෙනත් අය කිරීම්වලට නිෂ්පාදකයා යටත් විය යුතු ය.”.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

47. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"අපනයනය, නැවත ගුදම් ගත කිරීම හෝ දේශීය පරිහරණය සඳහා සටහන් කිරීම.

85. ගුදම්ගත කරන ලද බඩු කිසිවක්, අපනයනය සඳහා හෝ ගබඩා ද්‍රව්‍ය වශයෙන් නැව්ගත කිරීම සඳහා හෝ එක් ගුදමකින් තවත් ගුදමකට ඉවත් කිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් වූ සම්පූර්ණ තීරු බදු ගෙවනු ලැබූ විට දේශීය පරිහරණය සඳහා හෝ නිසි සටහනක් මත සහ රේගු අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව හැර, ගුදමෙන් ගැනීම හෝ භාරදීම කරනු නොලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.*

48. ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:—

"බැහැර යැවෙන බඩු සටහන් කරනු ලැබීමේදී නිසි පරිදි නැව්ගත කිරීම සහ ගොඩබෑම සම්බන්ධයෙන් නියම කරනු ලැබූ විට බැඳුම්කරයක් දීම.

89. තීරු බදුවලට යටත් ගුදම් ගත කරන ලද බඩු කිසිවක් අපනයනය කිරීම සඳහා අවසර දෙනු ලැබීමට පෙර, රේගු අධ්‍යක්ෂවරයා විසින් අපනයනය කළයුතු බඩු සඳහා වූ ඉල්ලුම සහ බඩුවල අගය සැලකිල්ලට ගනිමින්, නියම කරනු ලැබූ විට අපනයනකරු හෝ ඔහුගේ අනුයෝජිතයා විසින්, රේගු අධ්‍යක්ෂවරයා තීරණය කරන මුදලකින් සහ නැව්ගත කළයුතු සහ අපනයනය කළයුතු බඩුවල ස්වභාවය සහ අගය සැලකිල්ලට ගනිමින් රේගු අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව රේගු අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වන පරිදි ඒ බඩු නිසි පරිදි නැව්ගතකිරීම සහ අපනයනය කිරීම කළ යුතු බවට ද ඒ බඩු බැහැර යැවිය යුතු යයි සටහන් කරනු ලබන්නේ යම් ස්ථානයක් සම්බන්ධයෙන් ද ඒ ස්ථානයේ දී ගොඩබෑම කළ යුතු බවට හෝ අන්‍යාකාරයකින් ගිණුම්ගත කළයුතු බවට බැඳුම්කරයක් මගින් ඇප දෙනු ලැබිය යුතු අතර, නියම කරනු ලැබුවහොත්, ඉහත කී පරිදි ඒ වරායේ දී නිසි පරිදි බඩු ගොඩබෑම කරන ලද බවට ගොඩබානු ලබන වරායේදී නිසි නිලධරයන්ගේ අත්සන් යටතේ වූ සහතිකයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තිය සංශෝධනය කිරීම.*

49. ප්‍රධාන ප්‍රඥප්තියේ 96 වන වගන්තියේ "රුපියල් සියයක්" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය සංශෝධනය කිරීම.*

50. ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 100අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

51. 100 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 100අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය :—

" තීරු බද ගෙවූ බඩු සහ මෙරට සෑදූ බඩු ගුදම්ගත කිරීම.

100අ. (1) මේ ආඥාපනතේ II වන කොටසේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, මේ ආඥාපනතේ 69 වන වගන්තිය යටතේ නියම කරන ලද්දා වූ ද, 84අ වගන්තිය යටතේ එහි සැලසුම්කරණය සඳහා අවසර ලද්දා වූ ද යම් ගුදමක, ආනයනය කරනු ලැබ තීරු බදු කලින් ගෙවා ඇත්තා වූ බඩු හෝ මෙරට සාදන ලද්දා වූ බඩු, පාවිච්චිය සඳහා මුල් ප්‍රවේශයේදී තීරු බදු නොගෙවා ගුදම්ගත කරන ලද බඩු ද සමඟ, ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් නියම කරනු ලැබිය හැකි නියෝග යටතේ වූ බඩු නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම හෝ ඇසිරීම ද අතුලු සැලසුම්කරණය කිරීමේ කාර්යය සඳහා ගුදම්ගත කරනු පිණිස රේගු අයකැමිවරයා විසින් අවසර දෙනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) බඩු කිසිවක අයිතිකරු විසින් රේගු අයකැමිවරයා සෑහීමට පත්වන පරිදි නිසි අයුරින් ගිණුම්ගත නොකරන ලද්දා වූ එවැනි යම් ගුදමක ඇති ඒ බඩු රාජසන්තක කරනු ලැබිය යුතු ය.

(3) මේ ආඥාපනතේ 69 සිට 100 දක්වා වූ වගන්තිවල විධිවිධාන, (1) වන උපවගන්තියේ සඳහන් සියලු බඩු සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ කරනු ලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

52. ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" නියෝග.

101. (1) නියම කළ යුතු බවට මේ ආඥාපනතින් නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් හෝ මේ ආඥාපනත යටතේ නියෝග සාදනු ලැබීමට නියමිත යම් කාරණයක් සම්බන්ධයෙන් සහ විශේෂයෙන් පහත දැක්වෙන කාර්ය අතුරින් කිසිවක් සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) රේගු පරිශ්‍රය ඇතුළත ගින්නෙන් ඇතිවන හදිසි අනතුරු වැළැක්වීම සඳහා සහ ඉටිපන්දම්, ගින්දර හා ලාම්පු ඇල්වීම හෝ පාවිච්චි කිරීම පිළිබඳව සහ දුම්වැටි හෝ බෙහෙත් වැටි ඉරීම පිළිබඳව ;

(ආ) රේගු පරිශ්‍රය ඇතුළත පෝටර්වරුන්, කම්කරුවන්, කරත්තකරුවන්, සහ බඩු ගෙන යන්නා වූ හෝ යම් සතකු හෝ වාහනයක් යොදා ගන්නා වූ හෝ ධාවනය කරන්නා වූ හෝ වෙනත් අය පාලනය කිරීම සහ විධිමත් කිරීම සඳහා;

(ඇ) රේගු පරිශ්‍රය ඇතුළත බඩු හෝ දේපළ කිසිවකට හානි පැමිණවීම වැළැක්වීම සඳහා;

(ඈ) රේගු පරිශ්‍රයට තැනැත්තන් ඇතුල් කිරීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම සඳහා සහ ඒ පරිශ්‍රයෙන් තැනැත්තන් බැහැර කිරීම සඳහා;

(ඉ) රේගු පරිශ්‍රය ඇතුළත තැනැත්තන්ගේ හැසිරීම විධිමත් කිරීම සඳහා;

(ඊ) බඩු කිසිවක් වෙනුවෙන් රේගු බදු ගණන් බලන පිණිස සැපයිය යුතු ලේඛන නියම කිරීම සඳහා සහ රේගු බදු අයකරනු පිණිස ඒ බඩු පරීක්ෂා කිරීම විධිමත් කිරීම සඳහා; සහ

(උ) 92 වන වගන්තියේ සිට 100 වන වගන්තිය දක්වා වූ වගන්ති යටතේ ඒ වගන්ති දෙක ද ඇතුළුව, නිකුත් කරන ලද බලපත්‍ර සඳහා අලුත් ආකෘති සහ ඒ බලපත්‍ර මකා දමනු ආකාරය නියම කිරීම සඳහා.

තවද, ඒ නියෝග ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය. ඒ නියෝගවලට අවනත නොවන යම් තැනැත්තකු වරදකට වරදකරු වියයුතු අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් පවත්වන ලද ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් විසිපන්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකකටම හෝ යටත් විය යුතු ය. අයකැමිවරයා විසින්, කරන ලද වරද පිළිබඳ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්, ඒ වරද සම්බන්ධයෙන් පැනවිය හැකි දඩයෙන් පහෙන් එකකට සමාන මුදලක් ගෙවනු ලැබූ විට, මේ වගන්තිය යටතේ වරද සමථයකට පත්කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ වරදක් සමථයකට පත් කිරීමෙහි නිදොස් කිරීමක බලය ඇත්තේ ය.

(2) මේ වගන්තියේ සහ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක "රේගු පරිශ්‍රය" යන්නෙන්, ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් ගැසට් පත්‍රයේ වූ නිවේදනයක් මගින් කලින් කල අර්ථ කථනය කරනු ලැබ ඇති රේගු පරිශ්‍රය අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 103අ සහ 103ආ අලුත් වගන්ති ඇතුළත් කිරීම.

53. 103 වැනි වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 103අ සහ 103ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"නැව් බඩු පිළිබඳ රේගු නිෂ්කාෂණය සඳහා කන්ටේනර් නැව්බඩු මධ්‍යස්ථාන හෝ අභ්‍යන්තර නිෂ්කාෂණ ගබඩා.

103අ. (1) රේගු අයකැමිවරයා විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, කලින් කල කරනු ලබන නියමයන් මගින්, නියම කරනු ලැබිය හැකි කාල සීමාවක් සඳහා සහ නියම හා කොන්දේසිවලට යටත්ව, මේ ආඥාපනතේ කාර්ය සඳහා කන්ටේනර් නැව් බඩු මධ්‍යස්ථාන සහ අභ්‍යන්තර නිෂ්කාෂණ ගබඩා පිහිටුවනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ පිහිටුවන ලද කන්ටේනර් නැව් බඩු මධ්‍යස්ථානයක හෝ අභ්‍යන්තර නිෂ්කාෂණ ගබඩාවක අයිතිකරු විසින් සැපයිය යුතු ඇප මුදල, එහි ගබඩා කළයුතු බඩුවල ස්වභාවිය සහ වටිනාකම සැලකිල්ලට ගනිමින් රේගු අයකැමිවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(3) රේගු අයකැමිවරයා විසින්, සමාන අනුමතයක් ඇතිව, සහ (1) වන උපවගන්තියේ සඳහන් නියම සහ කොන්දේසිවලට යටත්ව, සාධාරණ හේතුවක් මත කවර වූ හෝ අවස්ථාවක දී, (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ එවැනි යම් නියමයක නියම සහ කොන්දේසි වෙනස් කිරීම, කරනු ලැබිය හැකි ය.

කන්ටේනර්, කන්ටේනර්ගත නැව්බඩු, කන්ටේනර්ගත කිරීම සඳහා අදහස් කරන ලද නැව්බඩු ඔබ මොබ යැවීම සහ තැබිය යුතු ඇප විධිමත් කිරීම.

103ආ. (1) අමාත්‍යවරයා විසින්—

(අ) කන්ටේනර්වලට, කන්ටේනර්ගත නැව් බඩුවලට සහ කන්ටේනර්ගත කිරීම සඳහා අදහස් කරන ලද නැව් බඩුවලට අදාළ ලේඛන පිළියෙල කිරීම, ඒවා ගබඩා කිරීම, ඔබ මොබ යැවීම, පරීක්ෂා කිරීම, මුද්‍රා තැබීම සහ ඒවායේ ආරක්ෂාව සහ ඒවාට අදාළ වෙනත් සියලු කරුණු;

(ආ) කන්ටේනර්, කන්ටේනර්ගත නැව්බඩු සහ කන්ටේනර්ගත කිරීම සඳහා අදහස් කරන ලද නැව්බඩු ප්‍රවාහනයෙහි යෙදුනු තැනැත්තන් විසින් තැබිය යුතු ඇප මුදල

සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

කොන්දේසි කඩ කිරීම සම්බන්ධයෙන් දණ්ඩන.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද යම් නියෝග හෝ ඒ නියෝග මගින් හෝ ඒ යටතේ පනවන ලද යම් නියමයක්, යම් තැනැත්තකු කඩකරතොත් හෝ ඊට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිතොත්, ඒ තැනැත්තා සහ තත් කාලයෙහි බඩු භාරව සිටින තැනැත්තා විසින්, රේගු අයකැමිවරයාගේ විරණය පරිදි, එක් එක් අවස්ථාව සම්බන්ධයෙන් බඩුවල වටිනාකම මෙන් තෙගුණයක් ගෙවීම හෝ රුපියල් විසිපන් දහස කට නොවැඩි දණ්ඩනයකට යටත්වීම හෝ ඔහු විසින් කරනු ලැබිය යුතු ය.

රේගු ආඥාපනතේ වෙනත් සියලු විධිවිධාන අදාළ කළ යුතු බව.

(3) ලැබෙන නැව්බඩු ගොඩබෑම සහ නිශ්කාෂණය හෝ යැවෙන නැව්බඩු නැව්ගත කිරීම සහ නිශ්කාෂණය පිළිබඳව මේ ආඥාපනතේ වෙනත් සියලු විධිවිධාන සහ ඒ යටතේ සාදන ලද රීති සහ නියෝග කන්ටේනර්වලට, කන්ටේනර්ගත නැව් බඩුවලට සහ කන්ටේනර්ගත කිරීම සඳහා අදහස් කරන ලද නැව්බඩුවලට, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරනු ලැබිය යුතු ය.".

54. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"බැඳුම්කර යටතේ ගොඩබිමින් බඩු ප්‍රවාහනය කිරීම.

104. (1) ආනයනය කරන ලද්දා වූ හෝ රේගුව විසින් බඩු මුදා හැරීමෙන් පසු, මේ ආඥාපනත යටතේ තීරුබදු සහ වෙනත් ගාස්තුවලට යටත් වන්නා වූ ද රේගුව වෙත ඒ තීරු බදු සහ වෙනත් ගාස්තු නොගෙවන ලද්දා වූ ද යම් කන්ටේනර් නැව්බඩු මධ්‍යස්ථානයකින් බැඳුනු ගුදමකින් හෝ රේගු පරිශ්‍රයකින් අපනය නය කරනු ලැබිය යුතු වූ ද බඩු කිසිවක්, එක් ස්ථානයකින් වෙනත් ස්ථානයකට ප්‍රවාහනය කරනු ලැබීම, ප්‍රධාන රේගු අයකැමිවරයා වෙත ලියා පදිංචි වූ සහ තීරු බදු සහ වෙනත් ගාස්තු ගෙවීම සඳහා බැඳුම්කරයක් මගින් ඇප තැන්පත් කර ඇත්තා වූ ද ප්‍රවාහකයකු නොවන තැනැත්තකු විසින් කරනු නොලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ විධිවිධාන කඩ කරමින් බඩු ප්‍රවාහනය කරන යම් තැනැත්තකු වරදකට වරද කරු විය යුතු අතර, රුපියල් එක් ලක්ෂයක් නො ඉක්මවන දණ්ඩනයකට යටත් විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**55.** ප්‍රධාන ප්‍රඥප්තියේ 107 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" යම් නැවකින් එළියට ගන්නාවූ හෝ නැවක් ඇතුළට ගන්නා වූ හෝ යළු ගුදමකින් එළියට ගන්නා වූ හෝ බඩු යථා පරිදි සටහන් කරනු ලැබ නැත්නම් රාජ්‍යසන්තක කළ යුතු බව.

107. යම් බඩු, බඩු පෙට්ටි හෝ පාර්සල් යථා පරිදි සටහන් කරනු නොලැබ, යම් නැවකින් ගොඩබානු ලැබුවේ නම්, එළියට ගනු ලැබුවේ නම් හෝ පිට කරනු ලැබුවේ නම් හෝ ගුදමකින් එළියට ගනු ලැබුවේ නම් හෝ පිට කරනු ලැබුවේ නම් හෝ යම් නැවකට පටවනු ලැබුවේ නම් හෝ නැවක් ඇතුළට ගනු ලැබුවේ නම් හෝ නැවකට දෙනු ලැබුවේ නම් හෝ, ඒවා රාජ්‍යසන්තක කරනු ලැබිය යුතු ය :

එසේ වුවද, සෑමවිටම, 107අ වගන්තිය යටතේ සාදන ලද නියෝග මගින් අර්ථකථනය කර ඇති පරිදි මගීන්ගේ ගමන් බඩු සම්බන්ධයෙන් කිසිම සටහනක් අවශ්‍ය නොවේ. ".

අලුත් 107අ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

**56.** 107 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය, ප්‍රධාන ප්‍රඥප්තියේ 107අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

" රට ඇතුළට එන සහ රටින් පිටවී යන මගීන්ගේ ගමන් මලු පාලනය කිරීම.

107අ. (1) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ නිලධරයන් විසින් සහ නියෝගවලට අනුකූලව ශ්‍රී ලංකාවට පැමිණෙන යම් මගියකු පරීක්ෂා කිරීම සහ ඔහුගේ ගමන් මලු ගොඩබෑම, පරීක්ෂා කරනු ලැබීම සහ ඔහු වෙත භාර දීම ද සිදු කළ හැකි ය ; තවද ශ්‍රී ලංකාවට පැමිණෙන යම් මගියකුගේ ගමන් මලුවල හෝ ඔහු වෙත හෝ තුළ හෝ ඔහුගේ විධානයෙන් හෝ ඔහුගේ ගුප්තානුකූලතාව ඇතිව ගොඩ ඒමට පෙර හෝ ගොඩඒමෙන් පසු ඒ බඩු දමනු ලැබුවේ යම් ස්ථානයක ද ඒ ස්ථානයේ හෝ සඟවා තිබී අසුවන තහනම් කරනු ලැබූ හෝ සීමා කරනු ලැබූ හෝ රේගු කටයුතු සඳහා භාජනය නොකරනු ලැබූ බඩු අසුවුවහොත් එම බඩු ද බඩු පෙට්ටිවල අන්තර්ගත දේවල් ද රාජ්‍යසන්තක කළ යුතු ය.

(2) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ නිලධරයන් විසින් සහ නියෝගවලට අනුකූලව ශ්‍රී ලංකාවෙන් බැහැරව යන යම් මගියකු පරීක්ෂා කරනු ලැබීම සහ ඔහුගේ ගමන් මලු පරීක්ෂා කරනු ලැබීම සිදු කළ හැකි ය ; තව ද ශ්‍රී ලංකාවෙන් බැහැරව යන යම් මගියකුගේ ගමන් මලුවල හෝ ඔහු වෙත හෝ තුළ හෝ

ඔහුගේ විධානයෙන් හෝ ගුප්තානුකූලතාව ඇතිව නැව් නැගීමට පෙර හෝ නැගීමෙන් පසු ඒ බඩු දමනු ලැබුවේ යම් ස්ථානයක ද ඒ ස්ථානයේ හෝ සඟවා තිබී අසුවන තහනම් කරනු ලැබූ හෝ සීමා කරනු ලැබූ හෝ රේගු කටයුතු සඳහා භාජනය නොකරනු ලැබූ බඩු අසුවුවහොත් එම බඩු ද බඩු පෙට්ටිවල අන්තර්ගත දේවල් ද ඉහත සඳහන් බඩු අන්තර්ගත බඩු පෙට්ටිද රාජ්‍යසන්තක කළ යුතු ය.

(3) රේගු අයකැමිවරයා විසින් තත් කාර්යය සඳහා යථා පරිදි බලය පවරනු ලැබූ ස්ත්‍රියක් විසින් හැර වෙනත් තැනැත්තකු විසින් කිසිම ගැහැණු මගියකු පරීක්ෂා කරනු නො ලැබිය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනුමත කරනු නොලැබූ දින සිට පරිච්ඡින්න වී ඇති ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් එසේ පරිච්ඡින්න වී ඇති ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.".

57. ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 110 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"එක් ගුදමක හෝ රේගු පරිශ්‍රයක සිට තවත් ගුදමකට හෝ ස්ථානයකට බඩු ඉවත් කිරීම සඳහා රේගු අයකැමිවරයා විසින් නියම කරනු ලැබීම.

110. (1) මේ ආඥාපනතේ කාර්ය අතුරින් යම් කාර්යයක් සඳහා යෝග්‍ය යයි රේගු අයකැමිවරයා විසින් සලකනු ලබන්නේ නම්, ආනයනය කරන ලද බඩු ගබඩා කර ඇති ගුදමේ සිට හෝ රේගු පරිශ්‍රය තුල ඇති වෙනත් ස්ථානයේ සිට, ලිඛිත නියමයේ සඳහන් වෙනත් ගුදමකට හෝ රේගු පරිශ්‍රය තුළ ඇති ස්ථානයට ඒ නියමයේ සඳහන් කාලසීමාව ඇතුළත දී ගෙන යා යුතු බවට ද බඩු යථා පරිදි පරීක්ෂා කරනු ලැබීම සඳහා ඒ නියමයේ යම් දිනයක් හෝ වේලාවක් සඳහන් කර ඇත්නම් ඒ දිනයේදී හෝ වේලාවේ දී එහි පැමිණ සිටිය යුතු බවට ද රේගු අයකැමිවරයා විසින් ලිඛිත නියමයක් මගින් එකී බඩු ආනයනය කරන්නාට නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරන ලද නියමයකට, සාධාරණ හේතුවක් නොමැතිව, එකඟව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු රුපියල් දහ දහසක් නොඉක්මවන දණ්ඩනයකට යටත් විය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

53. ප්‍රධාන ප්‍රඥප්තියේ 115 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

" රේගු අයකැමි වරයා විසින් රේගු අනුයෝජිතයන් ට බලපත්‍ර ලබාදීම.

115. (1) ශ්‍රී ලංකාවේ වරාය හෝ ස්ථාන අතුරින් කිසිවක දී යම් නැවක් හෝ යම් බඩු හෝ ගමන් මලු ප්‍රවේශවීම හෝ නිශ්කාෂණය කිරීම සම්බන්ධයෙන් ව්‍යාපාර කටයුතු කිරීම සඳහා රේගු අනුයෝජිතයන් ලෙස ක්‍රියා කිරීම පිණිස මේ ආඥාපනතේ " උ " උපලේඛනයේ දක්වා ඇති නියමයන් සපුරාලන තැනැත්තන්ට එම උපලේඛනයේ සඳහන් පරිදි වූ ආකෘතියේ හා ආකාරයට ද නියම සහ කොන්දේසිවලට යටත්ව ද නියමිත ගාස්තුව ගෙවීමේ දී ඔහු විසින් බලපත්‍ර දෙනු ලැබිය හැකි අතර බලපත්‍ර ලබා දීම සඳහා ඔහුට මෙයින් බලය පවරනු ලැබේ. තවද එසේ බලපත්‍ර ලබාගත් තැනැත්තන් පමණක් ඉහත කී පරිදි රේගු අනුයෝජිතයන් ලෙස ක්‍රියා කළ යුතු අතර එවැනි යම් තැනැත්තකුට දෙනු ලැබ ඇති යම් බලපත්‍රයක්, වංචාව හෝ විෂමාචාරය සඳහා හෝ යම් නියම හෝ කොන්දේසි කඩකිරීමක් සඳහා හෝ රේගු අයකැමි වරයා විසින් අවලංගු කළ හැකි ය ; නැතහොත් ප්‍රත්‍යාඡ්ට කළ හැකි ය.

(2) මේ වගන්තිය යටතේ දෙනු ලැබූ සෑම බලපත්‍රයක්ම එක් අවුරුද්දක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු අතර, කාලසීමාව අවසාන වීමේදී නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු රේගු අයකැමි වරයා විසින් අලුත් කරනු ලැබිය හැකි ය.

සේවා නියුක්තයන් අනුයෝජිතයන් ලෙස සලකනු ලබන බව.

(3) මේ වගන්තියේ කාර්ය සඳහා ආනයනය කරන්නකුගේ හෝ අපනයනය කරන්නකුගේ යම් සේවා නියුක්තයකු රේගු අනුයෝජිතයකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඔහු (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් දරන්නේ නම් මිස, ඉහත කී පරිදි ව්‍යාපාර කටයුතු කිරීමට ඔහුට අවසර දෙනු නොලැබිය යුතු ය. ".

**59.** 115 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒය ප්‍රධාන ප්‍රඥප්තියේ 115අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 115අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"ආනයනය කරන්නන් සහ අපනයනය කරන්නන් රේගුවෙහි ලියාපදිංචි විය යුතු බව.

115අ. (1) මේ ආඥාපනත යටතේ රේගු අය කැමිවරයාගේ කර්තව්‍ය ඉටු කිරීම පහසුවීමේ කාර්යය සඳහා රේගු අයකැමිවරයා විසින් නියම කරනු ලැබිය හැකි පරිදි වූ විස්තර ලබා දෙමින් රේගුවෙහි ලියාපදිංචි වන ලෙස සෑම බඩු ආනයනය කරන්නෙකුටම සහ අපනයනය කරන්නෙකුටම රේගු අයකැමිවරයා විසින් නියම කිරීම නීත්‍යානුකූල වේ.

(2) ලියාපදිංචි ආනයනය කරන්නකු හෝ අපනයනය කරන්නකු විසින් හැර, බඩු කිසිවක් ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට අපනයනය කිරීම හෝ නොකළ යුතු ය.

(3) මේ වගන්තියේ ආනයනය කරන්නා යන්නෙන් වාණිජ කටයුත්තක් සඳහා තමාම සඳහා හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් හෝ බඩු ආනයනය කරන තැනැත්තකු අදහස් විය යුතු අතර, අපනයනය කරන්නා යන්නෙන් වාණිජ කටයුත්තක් සඳහා තමාගේ නමින්ම හෝ වෙනත් තැනැත්තකු වෙනුවෙන් හෝ බඩු අපනයනය කරන තැනැත්තකු අදහස් විය යුතු ය.".

**60.** ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 118 වන වගන්තිය සංශෝධනය කිරීම.

**61.** ප්‍රධාන ප්‍රඥප්තියේ 119 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 119 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ව්‍යාජ ප්‍රකාශ කිරීම, ව්‍යාජ ලේඛනවලට අත්සන් තැබීම, සහ ප්‍රශ්නවලට අසත්‍ය පිළිතුරු දීම.

119. අත්සන් කිරීමෙන් පමණක් සත්‍යායනය කිරීම සඳහා මේ ආඥාපනත මගින් නියම කර ඇත්තා වූ ද යම් විස්තරයක් සම්බන්ධයෙන් අසත්‍ය වන්නා වූ ද යම් ප්‍රකාශයක්, සහතිකයක් හෝ වෙනත් සාධන පත්‍රයක් යම් තැනැත්තකු විසින් පිළියෙල කරන්නේ නම් සහ ඔහු විසින් එවැනි ප්‍රකාශයකට, සහතිකයකට හෝ වෙනත් සාධන පත්‍රයකට දායක වන්නේ නම්; නැතහොත් රේගු අයකැමිවරයා හෝ රේගුවේ සුදුසු නිලධරයකු හෝ විසින් සලකා බැලීම සඳහා ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක යම් විස්තරයක් සම්බන්ධයෙන්

වූ යම් අසත්‍ය ප්‍රකාශයක් යම් තැනැත්තකු විසින් කරන්නේ නම් හෝ එවැනි ප්‍රකාශයකට අත්සන් තබන්නේ නම්; නැතහොත් රේගු නිලධරයන් විසින් තමා වෙත යොමු කරන ලද ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා මේ ආඥාපනත මගින් හෝ රේගුවට අදාළ වෙනත් යම් ප්‍රඥප්තියක් මගින් නියම කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ ප්‍රශ්නවලට සත්‍ය ලෙස පිළිතුරු නොදෙන්නේ නම්; නැතහොත් මේ ආඥාපනත මගින් හෝ රේගුවට අදාළ වෙනත් යම් ප්‍රඥප්තියක් මගින් නියම කරන ලද ලේඛනයක් හෝ රේගු අයකැමිවරයාගේ විධානයක් මගින් හෝ එය යටතේ නියම කරනු ලැබූ ලේඛනයක් හෝ රේගුවට අදාළ යම් ව්‍යාපාර කටයුත්තක් හෝ කාරණයක් කිරීම සඳහා ප්‍රයෝජනයට ගනු ලබන යම් සාධන පත්‍රයක් හෝ යම් තැනැත්තකු විසින් හොරෙන් මුද්‍රණය කරන්නේ නම් හෝ වංචාව පිණිස වෙනස් කරන්නේ නම් හෝ එවැනි ලේඛනයක් හෝ සාධන පත්‍රයක් හොරෙන් මුද්‍රණය කිරීමෙන් හා පසුව හෝ වංචාව පිණිස වෙනස් කිරීමෙන් පසුව පාවිච්චි කරන්නේ නම් හෝ යම් ලේඛනයක් හෝ සාධන පත්‍රයක් වංචා සහගත ලෙස වෙනස් කරන්නේ නම් හෝ එවැනි යම් ලේඛනයක් හෝ සාධන පත්‍රයක් සත්‍යායනය කිරීම සඳහා හෝ බඩුවල ආරක්ෂාව සඳහා හෝ රේගුවට අදාළ කටයුතු කිරීමේ දී වෙනත් යම් කාර්යයක් සඳහා රේගුවේ නිලධරයන්ගේ හෝ ඔවුන් විසින් පාවිච්චි කරනු ලබන නිල සලකුණක්, මුද්‍රාවක්, අත්සනක්, කෙටි අත්සනක් හෝ වෙනත් සලකුණක් යම් තැනැත්තකු විසින් කූටානුකරණය කරන්නේ නම්, එසේ කඩ කරන සැම තැනැත්තකුගෙන්ම එවැනි සැම කඩ කිරීමක් සඳහාම රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන මුදලක් රාජ්‍යසන්තක කළ යුතුය; තවද ලේඛනය හෝ ප්‍රකාශය කරනු ලැබුවේ යම් ආකාරයක වූ ව්‍යවහාර මුදල් ද ඇතුළුව යම් බඩු සම්බන්ධයෙන් ද ඒ බඩු සහ මුදල් රාජ්‍යසන්තක කිරීම සඳහා යටත් විය යුතු ය :

*ව්‍යාජ ලේඛන හොරෙන් මුද්‍රණය කිරීම සහ පාවිච්චි කිරීම.*

එසේ වුවද තත්කාලයෙහි බලපවත්නා යම් නීතියක් මගින් වෙනත් යම් දණ්ඩනයක් ප්‍රකාශිතවම පනවා ඇත්තේ යම් විශේෂිත කඩ කිරීමක් සම්බන්ධයෙන් ද ඒ කඩ කිරීම සඳහා මෙ දණ්ඩනය අදාළ නොවිය යුතු ය.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**62.** ප්‍රධාන ප්‍රඥප්තියේ 122 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

63. 123 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 123අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 123අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

" රේගුවේ පාලනයෙන් නිෂ්කාශණය කරනු ලැබූ බඩුවල සැම්පල ලබා ගැනීම.

123අ. ආනයනය කරනු ලැබූ බඩු රේගුවේ පාලනයෙන් නිශ්කාෂණය කරනු ලැබූ විට සහ යම් රේගු කාර්යයන් සඳහා එකී බඩුවල සැම්පල පරීක්ෂා කිරීම අවශ්‍යයයි රේගු අයකැමිවරයා විසින් සලකා එම බඩුවලින් සැම්පල ලබා ගැනීමට බලය දෙනු ලබන අවස්ථාවක දී, සැම්පලයක් හෝ සැම්පල ඉල්ලා ඇත්තේ ඒ බඩු රේගුවෙන් නිශ්කාෂණය කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත නම් ආනයනය කරන්නා විසින් හෝ බඩු තබා ඇත්තේ හෝ ගබඩා කර ඇත්තේ යම් ස්ථානයක හෝ පරිශ්‍රයක ද ඒ ස්ථානය හෝ පරිශ්‍රය භාරව සිටින තැනැත්තා විසින්, රේගු අයකැමිවරයා සෑහීමට පත්වන පරිදි එකී බඩුවල සැම්පලයක් හෝ සැම්පල වශයෙන් නිවැරදි බවට සහතික කළ හෝ එම බඩු නියෝජනය කරන සැම්පලයක් හෝ සැම්පල රේගු අයකැමිවරයා වෙත හෝ තත්කාර්යය සඳහා රේගු අයකැමිවරයා විසින් ලිඛිතව බලය දෙන ලද වෙනත් නිලධරයකු වෙත භාරදිය යුතු ය. බඩුවල සැම්පල ඉල්ලා, වැඩ කරන දින තුනක් ඇතුළත එම සැම්පල භාර දුන්නේ නැත්නම්, බඩු ගබඩා කර තිබිය හැකි ස්ථානයට ඇතුළු වී සැම්පල ලබා ගැනීම සඳහා රේගු අයකැමිවරයාට හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා ලිඛිතව අවසර දෙනු ලැබූ වෙනත් රේගු නිලධරයකුට බලය තිබිය යුතු ය.".

64. ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කිරීම.

65. 127 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ප්‍රධාන ප්‍රඥප්තියේ 127අ සහ 127ආ වගන්ති ලෙස ඒවා බලපැවැත්විය යුතු ය :— 127අ සහ 127ආ අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

' සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් ඇතැම් අවස්ථාවන්හි කරුණු යටතේ මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට ගෙන ආ යුතු බව.

127අ. මේ ආඥාපනත යටතේ වරදක් සඳහා 127 වන වගන්තිය ප්‍රකාරව සිරභාරයට ගනු ලැබ තමා ඉදිරියට පමුණුවනු ලැබූ තැනැත්තකු, විමර්ශන කිරීමට මැදිහත් විය හැකි තැනැත්තකු වන බව හෝ වරද පිළිබඳව නියි පරිදි විමර්ශනා කිරීම සඳහා එම තැනැත්තා පැය විසිහතරකට වැඩි කාලයක් සඳහා අත් අඩංගුවේ තබා ගත යුතු බව සුදුසු යයි හෝ රේගු අයකැමිවරයකුගේ මතය වන අවස්ථාවක දී, ඔහු විසින් එම තැනැත්තා මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

විමර්ශනය කිරීමේ කාර්ය සඳහා අත් අඩංගුවේ සිටින තැනැත්තන්.

127ආ. වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුවද, 127 වන වගන්තිය යටතේ සිරභාරයට ගනු ලැබ 127අ වගන්තිය යටතේ අත්අඩංගුවේ තබා සිටින යම් තැනැත්තකු සම්බන්ධයෙන් මේ ආඥා පනත යටතේ විමර්ශන කටයුතු පවත්වන රේගු නිලධරයකුට, ඒ තැනැත්තා හමුවීමේ අයිතිවාසිකමද විමර්ශන කටයුතුවල කාර්ය සඳහා යම් සාධාරණ වේලාවන් තුළ ඒ තැනැත්තා යම් ස්ථානයකට රැගෙන යාමේ අයිතිවාසිකමද තිබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තිය සංශෝධනය කිරීම.

66 ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තියේ (4) වන උප වගන්තියේ "රුපියල් එක් දහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම.

67. ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 130 වන වගන්තිය සංශෝධනය කිරීම.

68. ප්‍රධාන ප්‍රඥප්තියේ 130 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තිය සංශෝධනය කිරීම.

69. ප්‍රධාන ප්‍රඥප්තියේ 131 වන වගන්තියේ (2) වන උප වගන්තියේ "රුපියල් දස දහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තිය සංශෝධනය කිරීම.

70. ප්‍රධාන ප්‍රඥප්තියේ 132 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තිය සංශෝධනය කිරීම.

71. ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තිය සංශෝධනය කිරීම.

72. ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තිය සංශෝධනය කිරීම.**

73. ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තිය සංශෝධනය කිරීම.**

74. ප්‍රධාන ප්‍රඥප්තියේ 137 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 138 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

75. ප්‍රධාන ප්‍රඥප්තියේ 138 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ඇතැම් අවස්ථාවලදී, නිලධරයන් විසින් නැවක් ඇතුළත සිටින හෝ ගොඩබිම සිටින තැනැත්තන් පරීක්ෂා කළ හැකි බව.

138. යම් රේගු නිලධරයකු ශ්‍රී ලංකාවේ යම් වරායක හෝ ගුවන් තොටුපළක සීමා ඇතුළත ඇති යම් නැවක් ඇතුළට යාම සහ එම නැව ඇතුළත සිටින යම් තැනැත්තකු සහ ඔහුගේ ගමන් මලු ද එසේම ඔහුට අයත් වෙනත් බඩු ද පරීක්ෂා කිරීම නීත්‍යනුකූල වන අතර යම් නැවකින් ගොඩ බැස ඇති යම් තැනැත්තකු වෙත හෝ රේගු කාර්යාලය පසුකර යන හෝ පසුකර ගොස් ඇති යම් තැනැත්තකු වෙත හෝ ඔහුගේ ගමන් මලුවල හෝ ඔහුට අයත් බඩුවල හෝ සැඟවා රේගු පරීක්ෂණයට භාජනය නොකරනු ලැබූ හෝ සීමා කරනු ලැබූ හෝ තහනම් කරනු ලැබූ හෝ බඩු ඇති බවට විශ්වාස කිරීමට සෑහෙන හේතු එම රේගු නිලධරයාට ඇත් නම් එසේ නැවකින් ගොඩ බැස ඇති තැනැත්තා හෝ රේගු කාර්යාලය පසුකර යන හෝ පසුකර ගොස් ඇති තැනැත්තා රේගු නිලධරයා විසින් පරීක්ෂා කිරීම ද එසේම එකී තැනැත්තාට අයත් ගමන් මලු හෝ ඔහුට අයත් බඩු පරීක්ෂා කිරීම ද නීත්‍යනුකූල වන්නේ ය; එවැනි යම් කාර්යයක් ඉටු කිරීමේ දී එවැනි යම් නිලධරයාට ඇත් නම් එසේ නැවකින් ගොඩ නම් එවැනි සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර එසේ වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කිරීම.**

76. ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තියේ "රුපියල් දෙදහසක" යන වචන වෙනුවට "රුපියල් එක් ලක්ෂයක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 146 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

77. ප්‍රධාන ප්‍රඥප්තියේ 146 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"ආඥාපනතේ යම් වගන්තියක් යටතේ රාජ්‍ය සන්තක කිරීමට හෝ දණ්ඩනයට යටත් වන තැනැත්තන් වරදකට වරදකරුවන් වන බව.

146. මේ ආඥාපනතේ යම් වගන්තියක විධි විධාන යටතේ, යම් ක්‍රියාවක හෝ යම් නොකර හැරීමක හේතුවෙන් යම් බඩු හෝ මුදල් ප්‍රමාණයක් රාජ්‍ය සන්තක කිරීමට හෝ දඩයක් නොවන යම් දණ්ඩනයකට හෝ යම් තැනැත්තකු යටත් වන්නේ නම්, ඊට අමතරව ඒ තැනැත්තා වරදකට වරදකරු විය යුතු අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබීමේදී—

(අ) රාජ්‍ය සන්තක කිරීමට හෝ දණ්ඩනයට ඔහු යටත් වූයේ යම් ක්‍රියාවක හෝ නොකර හැරීමක හේතුවෙන් ද ඒ ක්‍රියාව හෝ නොකර හැරීම අදාළ වන්නේ මේ ආඥාපනතේ (ඊ) උපලේඛනයේ I වන තීරයේ දක්වා ඇති යම් බඩුවක් එම උපලේඛනයේ II වන තීරයේ දක්වා ඇති ප්‍රමාණවලට වඩා වැඩියෙන් ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් නම්, එම උපලේඛනයේ III වන තීරයේ අනුරූප සටහනේ දක්වා ඇති දණ්ඩනයට ඔහු යටත් විය යුතුය ; තවද

(ආ) රාජ්‍ය සන්තක කිරීමට හෝ දණ්ඩනයට ඔහු යටත් වූයේ යම් ක්‍රියාවක හෝ නොකර හැරීමක හේතුවෙන් ද ඒ ක්‍රියාව හෝ නොකර හැරීම අදාළ වන්නේ මේ ආඥාපනතේ (ඊ) උපලේඛනයේ දක්වා නොමැති බඩු කිසිවක් ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් නම් සහ ඒ බඩුවල වටිනාකම රුපියල් දෙලක්ෂ පනස් දහසකට වැඩි වන්නේ නම්, ඔහු මාස තුනකට අඩු නොවූ සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් විසිපන් දහසකට වැඩි නොවන දඩයකට හෝ එම බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ යටත් විය යුතුය ;

(ඇ) ක්‍රියාව හෝ නොකර හැරීම ඒ ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් අදාළ නොවන්නේ නම්, ඔහු අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකටම හෝ යටත් විය යුතු ය :

එසේ වුවද, අවශ්‍යතාවෝචිත පරිදි, රාජ්‍ය සන්තක මුදල හෝ දණ්ඩන මුදල පනවනු ලැබුවද පනවනු ලැබ නැති වුවද, එම මුදල යම් තැනැත්තකුගෙන් අය කර ගනු ලැබිය නොහැකි බව හෝ අය කර ගැනීමට ඉඩ නැති බව ප්‍රධාන රේගු අයකැමි වරයාගේ මතය වන්නේ නම් මිස, මේ වගන්තිය යටතේ ඒ තැනැත්තාට විරුද්ධව කිසිම නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.".

78. ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 153 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" මේ ආඥාපනත යටතේ අයකර ගනු ලැබූ රාජ්‍ය සන්තක මුදල් සහ දණ්ඩන මුදල් වැය කිරීම.

153. (1) මේ ආඥාපනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සමග කියැවිය යුතු මේ ආඥාපනත යටතේ අයකර ගනු ලැබූ සියලුම රාජ්‍ය සන්තක මුදල් සහ දණ්ඩන මුදල් ද ;

(2) මේ ආඥාපනතේ 162 වන වගන්තිය යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සමග කියැවිය යුතු මේ ආඥාපනත යටතේ රේගු අයකැමිවරයා විසින් බැහැර කරනු ලැබිය හැකි පරිදි වූ සියලු බඩු විකිණීමෙන් ලැබෙන මුදල් ද ඒ රේගු අයකැමිවරයා වෙත ගෙවනු ලැබිය යුතු අතර එකී මුදල් (ඇරීමට සිදුවූ වියදම් අඩු කිරීමෙන් පසු) පහත දැක්වෙන පරිදි ගෙවනු ලැබීම සහ යොදා ගැනීම කරනු ලැබිය යුතු ය :—

(අ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට දෙකෙන් පංගුවක් ද එම මුදලින් සියයට හැටක් ඒකාබද්ධ අරමුදලට ද ඉතිරි සියයට හතලිහ (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් මේ ආඥාපනතේ සඳහන් කරනු ලබන) රේගු නිලධරයන්ගේ සුබ සාධන සහ වන්දි අරමුදලට ; සහ

(ආ) අමාත්‍යවරයා විසින් අනුමත කළ යුතු යෝජනා ක්‍රමයකට අනුව අදාළ නිලධර යන් සහ තොරතුරු සපයන්නන් අතර බෙදා දීම සඳහා ප්‍රධාන රේගු අයකැමි වරයා යටතේ ඇති ත්‍යාග අරමුදලකට අනෙක් පංගුව.".

ප්‍රධාන ප්‍රඥප්තියට 153 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

79. 153 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 153අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

"අරමුදලේ මුදල් යොදවා ගත හැකි කාර්ය.

153අ. (1) අරමුදලේ මුදල් පහත දැක්වෙන කාර්ය සඳහා උපයෝගී කර ගත යුතු ය :—

(අ) රේගුව කළමනාකරණයෙහි සඵලතාව වැඩි දියුණු කිරීම පිණිස ප්‍රධාන රේගු අයකැමි වරයාට පෙනීයන පහසුකම් සලසා දීම ; සහ

(ආ) ස්ථිර වශයෙන් හෝ පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් අබල වූ හෝ තාවකාලිකව අශක්නුතාවකට පත් වූ යම් රේගු නිල ධරයකුට වන්දි මුදල් ලබා දීම හෝ යම් රේගු නිලධරයකු මිය ගියවිට ඔහුගේ නීත්‍යනුකූල උරුමක්කාරයන්ට වන්දි මුදල් ලබා දීම ; කෙසේ වෙතත් අවස්ථා වෝචිත පරිදි, එම අබලතාව, අශක්නු තාව හෝ මරණය සිදු වූයේ පහත සඳ හන් තුවාලයක් නිසා විය යුතු ය :—

(i) ඒ නිලධරයා රාජකාරියේ යෙදී සිටි යදී සිදු වූ තුවාලයක් ; හෝ

(ii) ඒ නිලධරයා— ...

(අ) රාජකාරියට වාර්තා කිරීම සඳහා සිය වාසස්ථානයේ සිට සිය සේවා ස්ථාන යට යමින් සිටිය දී සිදු වූ තුවාලයක් ; හෝ

(ආ) රාජකාරියෙන් පසුව සිය සේවා ස්ථානයේ සිට සිය වාසස්ථානය කරා යමින් සිටිය දී සිදු වූ තුවාලයක් ; හෝ

(iii) ඒ නිලධරයා රාජකාරියේ යෙදී නොසිටිය දී තමාගේ සාමාන්‍ය රාජ කාරි කටයුතුවල විෂය පථයට ගැනෙන යම් ක්‍රියාවක් ඉටු කිරී මේ දී සිදු වූ තුවාලයක් ; හෝ

(iv) තමාගේ රාජකාරී කටයුතු ක්‍රියාත්මක කිරීමෙහිලා ඉටු කරන ලද ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් ඒ නිලධරයාට සිදු වූ තුවාලයක් ; හෝ

(v) තම රාජකාරී කටයුතු ඉටුකිරීමෙහිලා ඒ නිලධරයා විසින් ගන්නා ලද යම් ක්‍රියා මාර්ගයක් නිසා ඇති වූ හෝ පැන නැගුන යම් පළිගැනීමේ ක්‍රියාවක ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට සිදු වූ තුවාලයක්.

(2) ඒ වන්දි මුදල් ලබා දෙන්නේ යම් ප්‍රතිපත්ති සහ කොන්දේසිවලට යටත්ව ද ඒ ප්‍රතිපත්ති සහ කොන්දේසි සඳහා ද එවැනි අරමුදලක් පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන හෝ යෝග්‍යවන සියලු කරුණු සඳහා ද අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව ප්‍රධාන රේගු අයකැමිවරයා විසින් නියෝග මගින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(3) රේගු නිලධරයකුගේ අබලතාව, අශක්නුතාව හෝ මරණය සම්බන්ධයෙන් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ සාදනු ලැබූ නියෝගවලට අනුව දෙනු ලබන යම් වන්දි මුදලක්, විශ්‍රාම වැටුප් සංග්‍රහය හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එවැනි අබලතාවක්, අශක්නුතාවක් හෝ මරණයක් සම්බන්ධයෙන් දෙනු ලබන යම් විශ්‍රාම වැටුපකට, පාරිතෝෂිකයකට, වන්දි මුදලකට, දීමනාවකට හෝ වෙනත් ප්‍රතිලාභයකට අමතරව විය යුතු ය.".

80. 166 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ 166අ වගන්තිය සහ 166ආ වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියට 166 අ සහ 166 ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

" වරද බඩු සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, ඒ බඩුවල වටිනාකම රුපියල් ලක්ෂ පහක් ඉක්ම වන්නේ නම්, ඒ වරද ඇප දිය නොහැකි වරදක් ලෙස සැලකිය යුතු බව.

166අ. මේ ආඥාපනතේ 129 වන වගන්තිය හෝ 130 වන වගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු සැක කරන අවස්ථාවක දී සහ වරද සිදු කරනු ලැබ ඇත්තේ යම් බඩු සම්බන්ධයෙන් ද ඒ බඩුවල වටිනාකම රුපියල් ලක්ෂ පහක් ඉක්මවන අවස්ථාවක දී, මේ ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, ඒ වරද, ඇපදිය නොහැකි වරදක් ලෙස සලකනු ලැබිය යුතු ය.

දණ්ඩනයක් පැනවීම හෝ රාජ්‍ය සන්තක කිරීම නියම කිරීම සඳහා වූ ගුරු උපදෙස්.

166අ. 27, 28, 29, 30, 31, 32, 38, 47, 52, 56, 57, 59, 62, 63, 64, 67, 68, 74, 76, 77, 110, 119, 129, 130, 131, 132, 133, 135, 136 සහ 137 යන වගන්ති යටතේ දණ්ඩන මුදලක් පැනවීමේ දී හෝ රාජ්‍ය සන්තක මුදලක් නියම කිරීමේ දී, ප්‍රධාන රේගු අය කැමිවරයා පනත සඳහන් කරුණු පිළිබඳව සැලකිල්ලක් දක්විය යුතු ය :—

(අ) දණ්ඩනය හෝ රාජ්‍ය සන්තක කිරීම සඳහා මුල් වූ කඩකිරීමෙහි බරපතලකම ;

(ආ) ඒ කඩකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් අහිමි වූ ආදායම් මුදලේ ප්‍රමාණය ;

(ඇ) ඒ කඩ කිරීම සිදු කරනු ලැබ ඇත්තේ යම් භාණ්ඩ සම්බන්ධයෙන් ද අවස්ථාවෝචිත පරිදි ඒ භාණ්ඩවල සුලභ බව හෝ හිඟ කම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තිය සංශෝධනය කිරීම.

81. ප්‍රධාන ප්‍රඥප්තියේ 167 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "රේගු අයකැමිවරයා" යන අර්ථකථනයට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් අර්ථකථන ඇතුළත් කිරීමෙන් :—

"කන්ටේනර් නැව්බඩු මධ්‍යස්ථානය" හෝ "අභ්‍යන්තර නිශ්කාෂණ ගබඩාව" යන්නෙන්—

(අ) කන්ටේනර්වලින් එළියට ගත් බඩු හෝ කන්ටේනර් වලට පැටවීමට ඇතිබඩු රේගු පාලනය යටතේ ඒ බඩු ගබඩා කිරීම සහ නිශ්කාෂණය කිරීම සඳහා ;

(ආ) බඩු පටවා ඇති කන්ටේනර් ගබඩා කිරීම සඳහා ;

(ඇ) හිස් කන්ටේනර් ගබඩා කිරීම සඳහා රේගු අයකැමිවරයා විසින් නම් කරන ලද ස්ථාන යක් අදහස් වේ ;

"රේගු කාර්යාලය" යන්නෙන්, රේගු කටයුතු සිදු කිරීම සඳහා වූ ස්ථානයක් අදහස් වේ ;

(2) "අයිතිකරු" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"වරාය" යන්නට, රේගු ගගන යාත්‍රාංගණයක් ද ඇතුළත් වේ ;

(3) "නෞකාව" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"නෞකාව හෝ යාත්‍රාව" යන්නට, සියලුම විස්තරවල නෞකා සහ යාත්‍රා ඇතුළත් වන අතර ගුවන් යානාවක් ද එයට ඇතුළත් වේ;

(4) "නෞකාව හෝ යාත්‍රාව" යන්නෙහි අර්ථකථනයට ඉක්බිතිවම පහත දක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් :—

"නැවක පටවන ලද බඩු" යන්නෙහි ව්‍යාකරණ ප්‍රභේද සහ සජාතිය යෙදුම් ද සමග ගුවන් යානාවකට බඩු පැටවීම ද ඇතුළත් වේ; තවද

(5) "සත්‍ය වටිනාකම" යන්නෙහි අර්ථකථනය වෙනුවට පහත දක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :—

"වටිනාකම" යන්නෙන්, ආනයනය කරන ලද භාණ්ඩ සම්බන්ධයෙන් වන විට, ඒ භාණ්ඩ ආනයනය කරනු ලැබ ඇත්තේ නීත්‍යනුකූලව වුව ද නැතහොත් අන්‍යාකාරයෙන් වුව ද "ඉ" උපලේඛනය අනුව තීරණය කළ හැකි පරිදි ඒ භාණ්ඩවල වටිනාකම අදහස් වේ;".

**82.** ප්‍රධාන ප්‍රඥප්තියේ අවසානයට පහත දක්වෙන කරුණු එකතු කිරීමෙන් එය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— අලුත් උපලේඛන එකතු කිරීම.

"ඉ" උපලේඛනය 51 වන වගන්තිය

1. ආනයනය කරන ලද බඩු කිසිවක වටිනාකම එහි සාමාන්‍ය මිල විය යුතු ය. එනම් 2.7 වන ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි එකිනෙකාගෙන් ස්වාධීනව විකුණුම්කරු සහ ගැනුම්කරු අතර විවෘත වෙළෙඳ පොළේ දී කරනු ලබන විකිණීමකදී ආනයනය කරනු ලබන අවස්ථාවේදී ලබා ගත හැකි මිල වේ.

2. ආනයනය කරන ලද බඩු කිසිවක සාමාන්‍ය මිල තීරණය කරනු ලැබිය යුත්තේ පහත දක්වෙන පූර්ව නිගමන මතය :—

2.1 ගැණුම්කරුට බඩු භාර දෙනු ලැබූ වරායේ දී හෝ ශ්‍රී ලංකාවේ ගොඩබාන දෙනු ලැබූ ස්ථානයේ දී බව; එනම් බඩු පළමුවරට ගොඩබානු ලබන්නේ යම් වරායකින් හෝ ගුවන් තොටුපලකින් ද එම වරාය හෝ ගුවන් තොටුපල නැතහොත් වෙනත් අවස්ථාවලදී බඩු සම්බන්ධයෙන් පළමුවරට රේගු නිලධරයන් ක්‍රියා කරන්නේ යම් ස්ථානයක දී ද ඒ ස්ථානය වේ;

2.2 වරායේ දී හෝ ගොඩබෑදීමේ ස්ථානයේ දී බඩු විකිණීමට හෝ භාර දීමට ආනුෂංගික වූ ද එම නිසා සාමාන්‍ය මිලට ඇතුළත් කරනු ලැබුවා වූ ද සියලු ගාස්තු, අයකිරීම් සහ වියදම් විකුණුම්කරු විසින් දරන බව;

2.3 2.2 ඡේදයේ සඳහන් ගාස්තු, අයකිරීම් සහ වියදම්වලට වෙනත් කරුණු අතර පහත සඳහන් දේ ද ඇතුළත් වේ:—

2. 3. 1 ශ්‍රී ලංකාවට ප්‍රවාහනය කිරීම සහ ප්‍රවාහන කුලිය ;

2. 3. 2 රක්ෂණ ගාස්තු ;

2. 3. 3 කොමිස් මුදල් ;

2. 3. 4 මිලදී ගැනීම සම්බන්ධයෙන් වන බ්‍රෝකර් ගාස්තු ;

2. 3. 5 දූත මෙහෙවර ගාස්තු හැර, ශ්‍රී ලංකාවට බඩු හඳුන්වාදීමට ආනුෂංගික වූ ලේඛන ශ්‍රී ලංකාවෙන් පිටත දී පිළියෙල කිරීම සඳහා දරන ලද ගාස්තු, අයකිරීම් සහ වියදම් ;

2. 3. 6 තීරුබදුවලින් හා බදුවලින් නිදහස් කරනු ලැබූ බඩු හෝ ආපසු ගෙවීම් මාර්ගයෙන් මුදවන ලද නැතහොත් මුදවනු ලබන බඩු හෝ හැර ශ්‍රී ලංකාවෙන් පිටතදී අදාළ වන තීරුබදු හා බදු ;

2. 3. 7 තීරුබදු පැනවීමේ කාර්යය සඳහා වෙන් වශයෙන් වූ භාණ්ඩ ලෙස සලකනු ලබන කන්ටේනර් හැර කන්ටේනර්වල වියදම ද, ශ්‍රමය, උපකරණ හෝ වෙනත් කරුණක් සඳහා වූ ඇසිරීමේ වියදම ද ;

2. 3. 8 පැටවීමේ ගාස්තු ;

2.4 ශ්‍රී ලංකාවේදී අදාළ වන සියලුම තීරුබදු සහ වෙනත් අයකිරීම් ගැණුම්කරු විසින් දරන බව ;

2.5 විකිණීම, තක්සේරු කිරීමට ඇති ප්‍රමාණයේ විකිණීමක් බව ;

2.6 තක්සේරු කිරීම සඳහා අදාළ කාලය විය යුත්තේ රේගු ආඥාපනතේ 16 වන වගන්තියෙහි අර්ථකථනය කර ඇති පරිදි ආනයනය කරන අවස්ථාව විය යුතු ය ;

2.7 විවෘත වෙළඳ පොලේදී විකුණුම්කරුවකු සහ ගැණුම්කරුවකු අතර එකිනෙකාගෙන් නිදහස් වූ විකිණීමකින් පූර්ව නිගමනය කරනු ලබන්නේ—

2. 7. 1 එකම ප්‍රතිෂ්ඨාව මිල වන බව ;

2. 7. 2 විකිණීම මගින් ඇති කරනු ලැබූ සම්බන්ධතාව මගින් හැර, විකුණුම්කරුගේ ව්‍යාපාර කටයුතුවලදී ඔහු සමග සම්බන්ධකමක් ඇති යම් තැනැත්තකු සහ ගැණුම්කරු හෝ ව්‍යාපාර කටයුතුවලදී ඔහු සමග සම්බන්ධකමක් ඇති යම් තැනැත්තකු අතර ඇති යම් වාණිජ, මූල්‍ය හෝ වෙනත් සම්බන්ධතාවක් මිල කෙරෙහි බල නොපාන බව ;

2. 7. 3 පසුව සිදුවන යම් නැවත විකිණීමකින් හෝ වෙනත් බැහැර කිරීමකින් හෝ බඩු ප්‍රයෝජනයට ගැනීමකින් ලැබෙන මුදල්වලින් කිසිම කොටසක් නියම වශයෙන් හෝ අනියම් වශයෙන් විකුණුම්කරුට හෝ ව්‍යාපාර කටයුතුවලදී ඔහු සමග සම්බන්ධකමක් ඇති යම් තැනැත්තකුට උපචිත නොවන්නේ ය ;

2. 7. 4 තැනැත්තන් දෙදෙනකු අතරින් එක් තැනැත්තකුට නියම වශයෙන් හෝ අනියම් වශයෙන් අනෙක් තැනැත්තාගේ ව්‍යාපාර කටයුතුවල හෝ දේපළෙහි යම් සම්බන්ධතාවක් ඇත්නම් හෝ ඒ තැනැත්තන් දෙදෙනාටම යම් ව්‍යාපාරයක හෝ දේපළක පොදු සම්බන්ධතාවක් ඇත්නම් හෝ ඒ තැනැත්තන් දෙදෙනාගේ ව්‍යාපාර කටයුතුවල හෝ දේපළෙහි යම් සම්බන්ධතාවක් යම් තුන්වන තැනැත්තකුට ඇත්නම් හෝ එකී තැනැත්තන් දෙදෙනාට ව්‍යාපාර කටයුතුවලදී යම් සම්බන්ධකමක් ඇති ලෙස සලකනු ලැබිය යුතු ය ;

2. 8. බඩු තක්සේරු කරනු ලබන විට—

2. 8. 1 ඒවා නිෂ්පාදනය කරනු ලැබ ඇත්තේ යම් පේටන්ට් බලපත්‍රයක් ලබාගත් නව නිපැයුමක් අනුව බවට හෝ ඒවාට යම් ආරක්ෂිත සැලසුමක් යොදා ඇති බවට; හෝ

2. 8. 2 ඒවා ආනයනය කරනු ලබන්නේ විදේශීය වෙළඳ ලකුණක් යටතේ බවට, පේටන්ට් බලපත්‍රය, ආරක්ෂිත සැලසුම හෝ වෙළඳ ලකුණ ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසිකමේ වටිනාකම ද සාමාන්‍ය මිලට ඇතුළත් කළ යුතු ය.

(මේ විධිවිධානය, ප්‍රකාශන අයිතිය හෝ වෙනත් යම් බුද්ධිමය හෝ කාර්මික දේපළ අයිතිවාසිකම් සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය):

එසේ වුව ද අයිතිවාසිකම් දරන්නේ ශ්‍රී ලංකාවේ සිටින තැනැත්තකු විසින් වන අවස්ථාවකදී රටේ ආර්ථික අවශ්‍යතා සලකා එවැනි වටිනාකමක් අමාත්‍යවරයා විසින් නියමයකින් බැහැර කරනු ලැබිය හැකි ය;

2. 8. 3 ඒවා ආනයනය කරනු ලබන්නේ නිෂ්පාදනය කිරීම සඳහා වන බවට සහ ඉන් පසුව ඒවා විකිණීමට හෝ අන් අයුරකින් බැහැර කරනු ලැබීමට හෝ විදේශීය වෙළඳ ලකුණක් යටතේ ප්‍රයෝජනය ගැනීමට ඇති විට දී, ඒවායේ සාමාන්‍ය මිලට, බඩු සම්බන්ධයෙන වන එම වෙළඳ ලකුණ ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ අයිතිවාසිකමේ වටිනාකම ද ඇතුළත් කළ යුතුය;

2. 9. වෙළෙඳ ලකුණක්—

(අ) තක්සේරු කිරීමට ඇති බඩු ශ්‍රී ලංකාවෙන් පිටත දී වගා කරනු ලැබුවේ, සාදනු ලැබුවේ, නිෂ්පාදනය කරනු ලැබුවේ, විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබුවේ හෝ ඒවා සම්බන්ධයෙන් අන් අයුරකින් ක්‍රියා කළේ යම් තැනැත්තකු විසින් ද ඒ තැනැත්තා ගේ වෙළෙඳ ලකුණක් නම්; හෝ

(ආ) ඉහත සඳහන් (අ) අනුඡේදයෙහි සඳහන් කර ඇති යම් තැනැත්තකු සමග ව්‍යාපාර කටයුතුවල සම්බන්ධකමක් ඇති යම් තැනැත්තකුගේ වෙළෙඳ ලකුණක් නම්; හෝ

(ඇ) ඉහත සඳහන් (අ) හෝ (ආ) අනුඡේදයේ සඳහන් යම් තැනැත්තකු සමග ඇති කර ගත් ගිවිසුමකින් වෙළෙඳ ලකුණෙහි තමාගේ අයිතිවාසිකම් සීමා කර ගනු ලැබුවේ යම් තැනැත්තෙක් ද ඒ තැනැත්තාගේ වෙළෙඳ ලකුණක් නම්

ඒ වෙළෙඳ ලකුණ විදේශීය වෙළෙඳ ලකුණක් ලෙස සලකනු ලැබිය යුතු ය.

3. තක්සේරු කරන අවස්ථාවේ දී මිල, ඉහත සඳහන් 1 වන ඡේදයේ දක්වා ඇති සාමාන්‍ය මිලට අනුරූප වන්නේ නම් රේගු කාර්ය සඳහා වටිනාකම ලෙස ගෙවූ මිල හෝ ගෙවනු ලබන මිල පිළිගනු ලැබිය හැකි අතර සාමාන්‍ය මිල සඳහා පදනම් කරගනු ලැබුවේ යම් අවස්ථානුගත කරුණු ද ඒ අවස්ථානුගත කරුණු වලින් වෙනස් වන විකිණීම පිළිබඳ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීම සඳහා අවශ්‍ය වන්නේ නම් මිල වෙනස් කරනු ලැබේ.".

'ඊ' උපලේඛනය

146 වන වගන්තිය

| I වන තීරය<br>බඩු | II වන තීරය<br>ප්‍රමාණය | III වන තීරය<br>දණ්ඩනය |
|---|---|---|
| රත්‍රන් කාසි, රත්‍රන් කුට්ටි සහ ස්වර්ණාභරණ ඇතුළත් රත්‍රන් | ග්‍රෑම් 50ක් හා ඊට වැඩි එහෙත් ග්‍රෑම් 100ට අඩු ... | අවුරුදු එකකට අඩු නොවන සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ග්‍රෑම් 100ක් හා ඊට වැඩි එහෙත් ග්‍රෑම් 500ට අඩු | අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ග්‍රෑම් 500ක් හා ඊට වැඩි එහෙත් ග්‍රෑම් 1000ට අඩු | අවුරුදු පහකට අඩු නොවන සහ අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ග්‍රෑම් 1000ක් හා ඊට වැඩි එහෙත් ග්‍රෑම් 3000ට අඩු | අවුරුදු දහයකට අඩු නොවන සහ අවුරුදු පහළොවකට වැඩි නොවන කාලයක් සඳහ දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ග්‍රෑම් 3000ක් සහ ඊට වැඩි ... | අවුරුදු පහළොවකට අඩු නොවන සහ අවුරුදු විස්සකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක් සහ දේපළ රාජ්‍යසන්තක කිරීම. |
| විදේශීය ව්‍යවහාර මුදල් හෝ මැණික් | ශ්‍රී ලංකා රුපියල් 15,000ට සහ ඊට වැඩි එහෙත් රු. 30,000ට අඩු මුදලකට සමාන | අවුරුදු එකකට අඩු නොවන සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ශ්‍රී ලංකා රුපියල් 30,000ට සහ ඊට වැඩි එහෙත් රු. 1,50,000 ට අඩු මුදලකට සමාන | අවුරුදු දෙකකට අඩු නොවන එහෙත් අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ශ්‍රී ලංකා රුපියල් 1,50,000ට සහ ඊට වැඩි එහෙත් රු. 3,00,000 ට අඩු මුදලකට සමාන | අවුරුදු පහකට අඩු නොවන එහෙත් අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ශ්‍රී ලංකා රුපියල් 3,00,000ට සහ ඊට වැඩි එහෙත් 1,000,000ට අඩු මුදලකට සමාන | අවුරුදු දහයකට අඩු නොවන සහ අවුරුදු පහළොවකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ශ්‍රී ලංකා රුපියල් 1000,000ට සහ ඊට වැඩි මුදලකට සමාන | අවුරුදු පහළොවකට අඩු නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක් සහ දේපළ රාජ්‍ය සන්තක කිරීමක්. |

| I වන තීරය<br>බඩු | II වන තීරය<br>ප්‍රමාණය | III වන තීරය<br>දණ්ඩනය |
|---|---|---|
| වියන ලද රෙදි පිළි, ලොම්, බන්ධිත කෙඳි සහිත රෙදි පිළි හෝ සමාන බන්ධිත නූල් රෙදිපිළි | මීටර් 300ක් සහ ඊට වැඩි එහෙත් මීටර් 600ට අඩු | අවුරුදු එකකට අඩු නොවන සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | මීටර් 600ක් සහ ඊට වැඩි එහෙත් මීටර් 3000ට අඩු | අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | මීටර් 3000ක් සහ ඊට වැඩි එහෙත් මීටර් 6000ට අඩු | අවුරුදු පහකට අඩු නොවන සහ අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | මීටර් 6000ක් සහ ඊට වැඩි එහෙත් මීටර් 20,000ට අඩු | අවුරුදු දහයකට අඩු නොවන සහ අවුරුදු පහළොවට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | මීටර් 20,000ක් සහ ඊට වැඩි ... | අවුරුදු පහළොවකට අඩු නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ දේපළ රාජ්‍ය සන්තක කිරීම. |
| (ලොමවලින් සෑදූ රෙදිපිළි, බන්ධිත කෙඳි සහිත රෙදි පිළි, සියුම් සිල්ක් වර්ග හෝ වෙනත් දැල් රෙදි වර්ග සහ රේන්ද ද ඇතුළත්ව) යම් රෙදි වර්ගයකින් සාදන ලද පැලඳීමේ භාණ්ඩ හා ගොතන ලද හා ක්‍රොචට් ද්‍රව්‍යවලින් සාදනා ලද භාණ්ඩ | කෑලි 300ක් සහ ඊට වැඩි එහෙත් කෑලි 600ට අඩු | අවුරුදු එකකට අඩු නොවූ සහ අවුරුදු දෙකට වැඩි නොවන කාලයක් සඳහා දෙයකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | කෑලි 600ක් සහ ඊට වැඩි එහෙත් කෑලි 3,000ට අඩු | අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමක්. |
| | කෑලි 3,000ක් සහ ඊට වැඩි එහෙත් කෑලි 6,000ට අඩු | අවුරුදු පහකට අඩු නොවන සහ අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමක්. |
| | කෑලි 6,000ක් සහ ඊට වැඩි එහෙත් කෑලි 20,000ට අඩු | අවුරුදු දහයකට අඩු නොවන සහ අවුරුදු පහළොවකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමක්. |
| | කෑලි 20,000ක් සහ ඊට වැඩි ... | අවුරුදු පහළොවකට අඩු නොවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමකට සහ දේපළ රාජ්‍ය සන්තක කිරීමට. |
| විදුලි උපකරණ සහ විද්‍යුත් උපකරණ | ඒකක 20ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 30ට අඩු | අවුරුදු එකකට අඩු නොවන සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ඒකක 30ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 50ට අඩු | අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්, |

| I වන තීරය බඩු | II වන තීරය ප්‍රමාණය | III වන තීරය දණ්ඩනය |
|---|---|---|
| | ඒකක 50ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 100ට අඩු | අවුරුදු පහකට අඩු නොවන සහ අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ඒකක 100ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 500 ට අඩු | අවුරුදු දහයකට අඩු නොවන සහ අවුරුදු පහළොවකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමක්. |
| | ඒකක 500ක් සහ ඊට වැඩි ... | අවුරුදු පහළොවකට අඩු නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමක්. |
| සියලු වර්ග වල අවි | ඒකක 2ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 4ට අඩු | අවුරුදු එකකට අඩු නොවන සහ අවුරුදු දෙකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමක්. |
| | ඒකක 4ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 6ට අඩු | අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමක්. |
| | ඒකක 6ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 10ට අඩු. | අවුරුදු පහකට අඩු නොවන සහ අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමක්. |
| | ඒකක 10ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 15ට අඩු | අවුරුදු දහයකට අඩු නොවන සහ අවුරුදු පහළොවකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ඒකක 15ක් සහ ඊට වැඩි ... | අවුරුදු පහළොවකට අඩු නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| වෙඩි ද්‍රව්‍ය (මිසයිලස් සහ පුපුරන ද්‍රව්‍ය ද ඇතුළත්ව) | ඒකක 2ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 5ට අඩු | අවුරුදු එකකට අඩු නොවන සහ අවුරුදු දෙකකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ඒකක 5ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 10ට අඩු | අවුරුදු දෙකකට අඩු නොවන සහ අවුරුදු පහකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාර ගත කිරීමක්. |
| | ඒකක 10ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 15ට අඩු | අවුරුදු පහකට අඩු නොවන සහ අවුරුදු දහයකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයකවූ බන්ධනාගාර ගත කිරීමක් |
| | ඒකක 15ක් සහ ඊට වැඩි එහෙත් ඒකක 20ට අඩු | අවුරුදු දහයකට අඩු නොවන සහ අවුරුදු පහළොවකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |
| | ඒකක 20ක් සහ ඊට වැඩි ... | අවුරුදු පහළොවකට අඩු නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමක්. |

## 'උ' උපලේඛනය

115 (1) වන වගන්තිය

### රේගු අනුයෝජිතයන් වෙත දෙනු ලබන බලපත්‍රයේ තිබිය යුතු නියම සහ කොන්දේසි

1. රේගු අනුයෝජිතයකු ලෙස බලපත්‍ර ලැබූ සෑම තැනැත්තකුට ම රේගුවේ ලියාපදිංචි කළ කාර්යාලයක් තිබිය යුතු ය.

2. රේගු අනුයෝජිතයකු ලෙස බලපත්‍ර ලැබූ සෑම තැනැත්තකුට ම රේගුවට අදාළ නීතිය සහ කාර්ය විධි පිළිබඳව මනා දැනුමක් තිබිය යුතු ය.

3. රේගු අනුයෝජිතයකු ලෙස බලපත්‍ර ලැබූ සෑම තැනැත්තකු විසින් ම, රේගු ආඥාපනත යටතේ වූ යම් වරදක් සඳහා ඔහු වෙත පනවනු ලැබිය හැකි දණ්ඩන සහ රාජ්‍ය සන්තක කිරීම් ද ඇතුළුව සියලු අයකිරීම් ගෙවීම සඳහා රේගු අයකැමිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයක මුදලින් වූ ඇපයක් හෝ රේගු අයකැමිවරයා විසින් අනුමත කළ හැකි වෙනත් ඇපයක් හෝ තැබිය යුතු ය.

83. මේ පනත ආරම්භ වන දිනයේ සිට, මෙහි උපලේඛනයේ I වන තීරයේ ඇති පදවිනාම දක්වා ඇත්තේ යම් ලිඛිත නීතියක ද, නැතහොත් යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ නිකුත් කරනු ලැබූ හෝ බලය පවරනු ලැබූ යම් දැන්වීමක, නිවේදනයක, ආකෘති පත්‍රයක හෝ වෙනත් ලේඛනයක ද ඒ සෑම අවස්ථාවක දීම එම උපලේඛනයේ II වන තීරයේ ඇති අනුරූප පදවි නාම ආදේශ කරනු ලැබිය යුතු ය. පදවිනාම වෙනස් කිරීම.

### උපලේඛනය

| I වන තීරය | II වන තීරය |
|---|---|
| ප්‍රධාන රේගු අයකැමිවරයා | රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා |
| නියෝජ්‍ය රේගු අයකැමිවරයා | රේගු අධ්‍යක්ෂවරයා |
| අතිරේක ගොඩබෑම් සමීක්ෂකවරයා | නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරයා |
| සහකාර රේගු අයකැමිවරයා | සහකාර රේගු අධ්‍යක්ෂවරයා |
| උප රේගු අයකැමිවරයා | රේගු අධිකාරීවරයා |
| රේගු නිලධාරී— I සහ II වන ශ්‍රේණි | සහකාර රේගු අධිකාරීවරයා I සහ II වන ශ්‍රේණි |
| වයිඩ්වේටර් | රේගු පරීක්ෂකවරයා I වන ශ්‍රේණිය |
| වයිඩ් සර්වේයර් | |
| කාන්තා සෝදිසි කරන්නා | |
| රේගු නියාමක | රේගු පරීක්ෂකවරයා II වන ශ්‍රේණිය |

84. යම් රාජ්‍ය සංස්ථාවක් පිහිටුවනු ලබන්නා වූ යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ රාජ්‍ය සංස්ථාව වෙත හෝ එහි ප්‍රයෝජනය හෝ සේවය සඳහා ප්‍රේෂණය කරන ලද නැතහොත් එහි ප්‍රයෝජනය හෝ සේවය සඳහා බැඳුණු ගුදමෙන් මිලදී ගත් සෑම භාණ්ඩයක් ම, ආනයන තීරු බදු ගෙවීමට යටත් විය යුතු ය. රාජ්‍ය සංස්ථා විසින් ආනයනය කරන ලද භාණ්ඩ ආනයන තීරුබදු වලට යටත් විය යුතු බව.